..........................................................................................................................................

..........................................................................................ඉදිකිරීමේ ව්‍යාපෘතිය

## ගිවිසුම් පත්‍රය

## මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ගොනු අංකය : MO/ME/PLN/01/.........................   ගිවිසුම් දිනය : 2022...............

එක් පාර්ශ්වයකට මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ මැදගම ප්‍රාදේශීය ලේකම් ධූරය නැමැති තත්කාලයේ දරණ, තමාගේ අනුප්‍රාප්තිකයන් සඳහා මින්මතු " සේවායෝජකයා " යනුවෙන් සඳහන් කරනු ලබන එකී ප්‍රාදේශීය ලේකම්වරයා සහ අනෙක් පාර්ශ්වයට, මෙහි මින්මතු ඇතැම් විට " ගිවිසුම්කරු " යනුවෙන් සඳහන් කරනු ලබන සහ ඒ යෙදුමට පද සම්බන්ධය අනුව අවශ්‍ය වන විට ස්වකීය උරුමක්කාරයන්, පොල්මක්කාරයන් සහ අද්මිනිස්ත්‍රාසිකාරයන් ද .......................................................................................................................................................................හී පදිංචි ..........................................................................අතර අනෙක් පාර්ශවයට ( මෙහි මින්මතු " ගිවිසුම්කරු " යනුවෙන් සඳහන් කරනු ලබන සහ ඒ යෙදුමට .......................................................................................දරණ ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ සමාගම් පනත යටතේ විධිමත් ලෙස සමාගමක් වන ........................................................................ අවශ්‍ය වන විට ස්වකීය අනුප්‍රාප්තිකයන් සහ අසරික පැවරුම්ලාභීන්ද ඇතුළත් වන එකී අතර ඇති කර ගන්නා ගිවිසුමේ වගන්ති මෙසේ වන්නේය.......................................................................................................................................................(කර්මාන්තයේ නම ) නිසි ආකාරයෙන් ඉටු කිරීමට පරිසමාප්ත කිරීමට ගිවිසුම්කරු සමඟ ගිවිසුමකට ඇතුළත්වීමට, ඉහත සඳහන් පරිදි ක්‍රියාකරමින් සේවා යෝජකයා කැමැත්ත දක්වා ඇති හෙයින් ද, කළයුතු කර්මාන්තය විස්තර කරන චිත්‍ර සටහන් , ප්‍රමාණ පත්‍රයට පිරිවිතර වලට මෙහි සඳහන් පාර්ශවකරුවන් විසින් කරනු ලැබ ඇති හෙයින්ද, එකී පාර්ශවයන් විසින් මෙසේ ගිවිසගන්නා ලදි.

**පරිසමාප්ත කළ යුතු දිනය**

01. මෙහි මින්මතු සඳහන් ප්‍රතිශ්ඨාව සලකා මෙයට යා කොට ඇති කොන්දේසි අනුව සහ ඒ කොන්දේසි වලට යටත්ව, ගිවිසුම්කරු විසින් එකී චිත්‍ර සටහන් වල පෙන්වා ඇති හෝ එකී පමාණ පත්‍රයේ සහ එකී පිරිවිතර වල සහ කොන්දේසි වල විස්තර කරනු ලැබ ඇති කර්මාන්තය මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි කාර්මික නිලධාරීවරයා තීරණය කරනු ලබන අතිරේක වැඩවල අත්හැරීම් වලට හා වෙනස්කම් වලට යටත්ව 2022 ක්වූ .........................................මස.......................................................... දින හෝ ඊට පෙර දක්ෂ වැඩකරුවෙකුගේ විලාශයෙන් සහ සතුටුදායක ආකාරයෙන් හොඳම ද්‍රව්‍ය යොදාගෙන කාර්මික නිලධාරීවරයා සෑහීමකට පත් වන පරිදි ඉටු කොට පරිසමාප්ත කළ යුතු ය. සේවා යෝජකයා විසින් සහ ගිවිසුම්කරු විසින් විධිමත් ලෙස අත්සන් කරනු ලැබ ඇති එකී චිත්‍ර සටහන් ද, එකී පිරිවිතර ද, එකී පමාණ පත්‍රය ද සියළුම කාර්යය සඳහා මෙම ගිවිසුමේ ඇතුළත් කොටසක් ලෙස කියවා තේරුම් ගත යුතු අතර, එහි කොටසක් ලෙස ද සැලකිය යුතු ය.

**ගිවිසුම් මුදල**

02. එහි කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරුට මෙහි මින් මතු " ගිවිසුම් මුදල " යනුවෙන් සඳහන් කරනු ලබන රුපියල් ....................................................................................................................................................................( වචනවලින් සහ ඉලක්කමෙන් ) ක් වූ මුදලක් ( වැට් සහ අවිනිශ්චිත වියදම් නොමැතිව ) හෝ මෙහි මින් මතු සඳහන් කර ඇති ආකාරයෙන්ද කාර්යාලයේ පවතින උප ලේඛණ අනුව ගිවිසුම යටතේ ගෙවිය යුතු වන යම් මුදලක් ගෙවනු ලැබේ.

**බැංකු ඇප**

03. එකී කර්මාන්තය මෙන්ම ගිවිසුම් ප්‍රකාර නියම කරනු ලැබිය හැකි අතිරේක වැඩ අත්හැරීම් හො වෙනත් වෙනස් කිරීම් ද සතුටුදායක ලෙස පරිසමාප්ති කිරීමෙන් මේ ගිවිසුම අනුව කළ යුතු වැඩ කටයුතු විධිමත් ලෙස සහ නිසි වේලාවට නිම කිරීම සඳහා සහ මෙම කර්මාන්තය පරිසමාප්ත කරන ලද දින සිට දින 14 ක් වූ කාල සීමාවක් තුළ කාර්මික නිලධාරීවරයාගේ උපදෙස් පරිදි එකී සියළු කර්මාන්ත මනා තත්ත්වයෙන් විධිමත් ලෙස නඩත්තු කිරීම සඳහා මෙම ගිවිසුමේ විධිවිධාන යටතේ සේවා යෝජකයාට අයිතිවාසිකම් සියළුම හිමිකම් විධිමත් ලෙස ගෙවීම සඳහා ඇපයක් ලෙස රුපියල් ...................................................................................................................( වචනවලින් සහ ඉලක්කමෙන් ) ක් සඳහා වූ ඇප සහතිකයක් ලෙස සේවා යෝජකයා විසින් අනුමත කරනු ලබන ආයතනයක සේවා යෝජකයා නමින් ඇපකරයක් ලියා අත්සන් කිරීමට ගිවිසුම්කරු මෙයින් පොරොන්දු වෙයි. මෙම ගිවිසුම යටතේ තමාගේ ස්වකීය බැඳීම් ගිවිසුම්කරු විධිමත් ලෙස නිදහස් හා පරිසමාප්ත කර ඇති බවට කාර්මික නිලධාරීවරයා දෙන සහතිකයෙහි සඳහන් වන දිනයේදී ගිවිසුම යටතේ වැය බරක් වශයෙන් සේවා යෝජකයාට කිසියම් මුදලක් අයවිය යුතු වන්නේ නම් , එය නිදහස් නොකරනු ඇත. සේවා යෝජකයාගේ නමින්ම රුපියල් ..................................................................................................................................................................................................................................................( වචනවලින් සහ ඉලක්කමෙන් ) ක් වූ මුදලක් පිළිගත් වානිජ බැංකුවක බැංකු බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතු බව ගිවිසුම්කරුට මෙයින් දන්වන අතර, ගිවිසුම්කරු එකී මුදල මෙයින් සේවා යෝජකයා වෙත උකස් කිරීම හා පැවරීම කරනු ලැබේ. මෙම ගිවිසුමේ සඳහන් කර්මාන්තය, ගිවිසුම්කරු විසින් විධිමත් ලෙස පරිසමාප්ත කරනු ලබන තුරු සහ මේ ගිවිසුම යටතේ උද්ගතවන සියලු බැඳීම් විධිමත් ලෙස නිදහස්



DS Office Medagama

CamScanner

කරනු ලබන තුරු සහ ඉටු කරන තුරු එකී මුදල හෝ ඉන් යම් කොටසක් හෝ ලැබීමට ගිවිසුම්කරුට හිමිකමක් නොමැත.
මෙහි විශේෂ වශයෙන් විස්තර කරනු ලැබූ කර්මාන්තය ගිවිසුම්කරු විසින් විධිමත් ලෙස පරිසමාප්ත කරනු ලබන විටෙක සහ ගිවිසුම්කරු විසින් ඉහත කී පරිදි සියළු බැඳීම්,පොරොන්දු, කොන්දේසි සහ නියමයන් නිදහස් කරනු ලබූ සහ ඉටු කරනු ලබන සහ ගෙවිය යුතු සියළු මුදල් ගෙවනු ලැබූ විටෙක, එකී..........................................................................................................................................................................................( වචනවලින් සහ ඉලක්කමෙන් ) ක් වූ මුදල හෝ එවකට ගිවිසුම්කරු වෙත ඒ මුදලින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ඉහත සඳහන් බැංකු බැදුම්කරය මෙහි සඳහන් වගකීමේ කාලසීමාව අවසානයේ දී ගිවිසුම්කරුට ආපසු ගෙවිය යුතු ය./ නිදහස් කළ යුතු ය. ඒ සමඟම මේ ගිවිසුම යටතේ ගිවිසුම්කරු විසින් තම ස්වකීය බැදීම් විධිමත් ලෙස නිදහස් කර ඇති බවට සහ ඉටු කර ඇති බවට සහ එකී රුපියල් ..........................................................................................................................................................................................( වචනවලින් සහ ඉලක්කමෙන් ) ක් වූ මුදල වෙනුවෙන් වැය බරක් ලෙස සේවා යෝජකයාට කිසිම මුදලක් අයවීමට නොමැති බවට ව්‍යාපෘතිය භාර කාර්මික නිලධාරීවරයාගේ සහතිකයක් ද ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද මෙම කර්මාන්තය නිම කරනු ලබන අවස්ථාවේ හෝ ගිවිසුම්කරු හෝ සේවා යෝජකයා අතර එළැඹුණු යම් ගිවිසුමක් හෝ එකගත්වයක් යටතේ ගිවිසුම්කරුගෙන් සේවා යෝජකයාට යම් මුදලක් හෝ මුදල් අය විය යුතු වූ අවස්ථාවක , මේ ගිවිසුම ඉටු කිරීම සඳහා ඇපයක් වශයෙන් තැන්පත් ඇති බැදුම්කරයක් ලෙස ඉදිරිපත් කර ඇති එකී රුපියල්..........................................................................................................................................................................................( වචනවලින් සහ ඉලක්කමෙන් ) ක් වූ මුදල හෝ ඉහත කී ලෙස මේ ගිවිසුම යටතේ ගිවිසුම්කරුට ආපසු ගෙවීමට ඇති කොටස රදවා ගැනීමට සහ මෙහි සඳහන් පරිදි සේවායෝජකයාට ගිවිසුම්කරු විසින් ගෙවිය යුතු මුදල හෝ මුදල් ගෙවීම සඳහා ඉහත කී මුදල නතු කර ගැනීමට සේවා යෝජකයාට අයිතාවාසිකම් ඇති බව ද ගිවිසුම්කරු සහ සේවායෝජකයා මෙයින් ප්‍රකාශිතවය ගිවිස ගනී. ගිවිසුම්කරු සහ සේවායෝජකයා අතර, එළැඹුණු වෙනත් යම් ගිවිසුමක් හෝ එකගත්වයක් යටතේ සේවායෝජකයාට අයවිය යුතු කවර හෝ යම් මුදලක් හෝ මුදල් ගිවිසුම්කරු විසින් අපයක් ලෙස එකී..........................................................................................................................................................................................( වචනවලින් සහ ඉලක්කමෙන් ) ක් වූ මුදල සේවායෝජකයා වෙත උකස් කරනු ලබන හා පවරනු ලබන අතර ඉහත සඳහන් පරිදි එවැනි යම් මුදලක් ගෙවීම සඳහා ඉහත කී මුදල නතු කර ගැනීමට සේවායෝජකායට අයිතිවාසිකම් තිබේ.

*කර්තව්‍ය හා බලතල පවරීම*

04. මෙම ගිවිසුම යටතේ තම කර්තව්‍ය සහ බලතල කාර්මික නිලධාරීවරයාට සහ හෝ වෙනත් යම් නිලධාරියෙකුට පැවරීමට සේවා යෝජකයාට අයිතිය තිබේ.

*කාර්මික නිලධාරියා විසින් අධීක්ෂණය කළ යුතු බව සහ විධාන දිය යුතු බව*

05. මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි හැර එකී කර්මාන්තය කළ යුතු ආකාරය පිළිබඳව හෝ භාවිතා කළ යුතු භාණ්ඩ හා ද්‍රව්‍ය වල ස්වභාවය හා තත්ත්වයන් පිළිබඳව හෝ කළ යුතු කර්මාන්තයේ නිමාව පිළිබඳව හෝ කාර්මික නිලධාරියා විසින් ලියවිල්ලෙන් දෙනු ලබන විධි විධාන සහ නියමයන් සේවා යෝජකයාගේ විධාන සහ නියමයන් වූ විටක මෙන් ගිවිසුම්කරු විසින් පිළිගත යුතු අතර, ඒවා අනුව ක්‍රියාකළ යුතු ය. තව ද, මෙහි මින්මතු විධි විධාන සලස්වා ඇති පරිදි කරන ලද කර්මාන්තය මැනීමටත්. ගිවිසුමේ කොන්දේසි වලට අනුකූල නොවන පරිදි යම් කොටසක් කර ඇති බව හෝ එසේ අනුකූල නොවන යම් ද්‍රව්‍යයක් භාවිතා කර ඇති බව කාර්මික නිලධාරියාට පෙනී ගිය හොත්, ඒ බව ගිවිසුම්කරුට හෝ ගිවිසුම්කරුගේ නියෝජිතයාට දැන්වීමටත්, ඒ කොටස කඩා බිද දමන ලෙස හෝ ඉවත් කරන ලෙස හෝ වෙනත් ද්‍රව්‍ය වලින් ඒ ද්‍රව්‍ය වෙන් කරන ලෙස නියම කිරීමටත්, ඒ කර්මාන්තය හෝ ද්‍රව්‍ය ලකුණු කිරීමට හා හඳුනාගැනීමටත් කාර්මික නිලධාරියාට බලය ඇත්තේ ය. ගිවිසුම්කරු විසින් කර්මාන්තය කරනු ලබන ආකාරය පරීක්ෂා කිරීම කාර්මික නිලධාරියාට සිදු කළ හැකි ය.මෙම ගිවිසුමේ අංක ................................................................................................ වගන්ති යටතේ සේවායෝජකයාට පමණක් බලය ලබා දී ඇති ක්‍රියා හැර මේ ගිවිසුම යටතේ කිරීමට සේවායෝජකයාට බලය දී ඇති වෙනත් ඕනෑම ක්‍රියාවක් කිරීමට ද කාර්මික නිලධාරියාට බලය ලැබේ.

ඒ කෙසේ වුවත්, අතිරේක වැඩකටයුතු සම්බන්ධයෙන් මෙම ගිවිසුමට වෙනස් වන ආකාරයෙන් ක්‍රියාකර ඇති අවස්ථාවල දී සේවායෝජකයා බැදීමකට යටත් කිරීමට කාර්මික නිලධාරියට බලයක් නැත.

*යෙදුම් සහ අර්ථදැක්වීම*

06. මෙම ගිවිසුමේ සහ / හෝ පිරිවිතර වල භාවිතා කරනු ලැබ ඇති පහත දැක්වෙන යෙදුම් වලට මෙයින් දී ඇති අර්ථ තිබෙන ලෙස එම යෙදුම් තේරුම්ගත යුතුය.

( අ ) " ප්‍රාදේශිය ලේකම්" යන්නෙන් පිළිවෙලින් තත්කාලින මැදගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශිය ලේකම් ධුරය දරන නිලධාරියා අදහස් වන්නේ ය.

( ආ ) " ගිවිසුම්කරු " යන්නෙහි මෙහි දක්වා ඇති කර්මාන්තය ඉටු කිරීමට, පරිසමාප්ත කිරීමට ගිවිසුම් කරගෙන සිටින යම් තැනැත්තෙක් හෝ ව්‍යාපාර ආයතනයක් හෝ සමාගමක් හෝ සමාගම් අදහස් වන අතර, ඒ යෙදුමට ඔහුගේ හෝ ඔවුන්ගේ උරුමක්කාරයින්,



DS Office Medagama
CamScanner

පොල්මක්කාරයින්, අද්මිනිස්ත්‍රාසිකාරයින්, අනුප්‍රාප්තිකයින් හෝ අවසරික පැවරුම්ලාභීන් ද ඇතුළත් වේ.

( ඇ ) " කාර්මික නිලධාරියා " යන්නෙන් මැදගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරි ධූරය තත්කාලයේ දරණ නිලධාරියා හෝ ගිවිසුම්කරු විසින් කරනු ලබන කර්මාන්තය පිලිබඳව තත්කාලයේ භාරව සිටින සහ ඒවා නිසි ලෙස අධීක්ෂණය කිරිම සඳහා ඍජුවම වග කියන ලබන සේවායෝජකයා විසින් බලය ලබාදෙන ලද වෙනත් යම් නිලධාරියෙකු අදහස් වන්නේ ය.

( ඈ ) " කර්මාන්තය " යන්නෙන් මේ ගිවිසුම යටතේ ගිවිසුම්කරු විසින් කළ යුතු සියළු වැඩ විෂයන් සහ දේවල් අදහස් වන්නේ ය.

( ඉ ) " මාසය "යන්නෙන් ලිත් මාසය අදහස් වන්නේ ය.

( ඊ ) " ගිවිසුම් ලේඛණ " යන්නෙන් මෙහි සඳහන් ගිවිසුම්, චිත්‍ර සටහන්, පිරිවිතර සහ ප්‍රමාණ පත්‍රය අදහස් වන්නේ ය.

( උ ) " ප්‍රමාණ පත්‍රය " යන්නෙන් මීට අමුණා ඇති ප්‍රමාණ පත්‍රය අදහස් වන්නේ ය.

( ඌ ) " චිත්‍ර සටහන " යන්නෙන් මේ ගිවිසුමේ විධිවිධාන පරිදි ප්‍රාදේශිය ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබ ඇති හෝ නිකුත් කරනුලබන චිත්‍ර සටහන අදහස් වන්නේ ය.

( එ ) " ගිවිසුම් මුදල " යන්නෙන් මෙම ගිවිසුමේ දෙවන ජේදයේ දැක්වෙන ආකාරයට ගිවිසුම්කරු වෙත ගෙවිය යුතු වන මුදල අදහස් වන්නේ ය.

( ඒ ) " කර්මාන්ත බිම " යන්නෙන් කර්මාන්තය නිසා යම් ආකාරයකින් බලපා තිබෙන හෝ බලපෑමකට ලක්විය හැකි ප්‍රදේශය අදහස් වන්නේ ය.

( ඔ ) " ගිවිසුමේ වටිනාකම " යන්නෙන් ප්‍රමාණ පත්‍රයේ දක්වා ඇති වටිනාකම අදහස් වන්නේ ය.

( ඕ ) " අතිරේක " යන්නෙන් කාර්මික නිලධාරිවරයාගේ මතය අනුව ගිවිසුමේ දක්වා ඇති වැඩ කටයුතු නිසි පරිදි පරිසමාප්ත කිරිම සඳහා කිරිමට අවශ්‍ය වන ප්‍රමාණ පත්‍රයේ සඳහන් වන යම් අයිතමයක විස්තර කර ඇති සහ අත්සන් කර ඇති චිත්‍ර සටහන් වල සාමාන්‍යයෙන් පෙන්වා ඇති වැඩ විෂයේ ප්‍රමාණය ඉක්මවා කර ඇති වැඩ විෂය ප්‍රමාණය අදහස් වන අතර, ප්‍රමාණ පත්‍රයේ නිශ්චිත වශයෙන් විස්තර කර නොමැති නමුත් කාර්මික නිලධාරිවරයාගේ මතය අනුව කර්මාන්තය නිසිලෙස පරිසමාප්ත කිරිම සඳහා අවශ්‍ය වන සහ සහ විස්තර කර ඇති වැඩ විෂයන්ට අමතරව හෝ වැඩ විෂයන් වෙනුවට කළ යුතු වැඩ විෂයන් ද ඇතුළත් වන්නේ ය.

( ක ) " අත්හැරිම " යන්නෙන් යම් වැඩ විෂය ප්‍රමාණයක් නොකර කර්මාන්තය තමා සෑහිමකට පත්වන පරිදි පරිසමාප්ත කළ හැකි යැයි කාර්මික නිලධාරිවරයාගේ මතය වන අවස්ථාවක ඒ වැඩ විෂය ප්‍රමාණය මෙයින් අදහස් වන අතර, වෙනත් වැඩ විෂයන් ආදේශ කිරිම නිසා හෝ වෙනත් හේතුවක් නිසා කාර්මික නිලධාරිවරයාගේ මතය අනුව කර්මාන්තය නිසි පරිදි පරිසමාප්ත කිරිම සඳහා අවශ්‍ය නොවන සහ ප්‍රමාණ පත්‍රයේ නිශ්චිත ලෙස විස්තර කර ඇති වැඩ කොටස් ද ඇතුළත් වන්නේ ය.

( ග ) " වෙනස්කම් " යන්නෙන් ගිවිසුමේ දක්වා ඇති සහ අත්සන් කරන ලද චිත්‍ර සටහන් වල සාමාන්‍යයෙන් පෙන්වා ඇති කර්මාන්තය නිසි පරිදි පරිසමාප්ත කිරිම පිණිස කාර්මික නිලධාරිවරයාගේ මතය අනුව අවශ්‍ය කරන ප්‍රමාණ පත්‍රයේ හෝ පිරිවිතරවල යම් වැඩ විෂයන් පිළිබඳ විස්තරයන්හි යම් වෙනස්කමක් අදහස් වන්නේ ය.

මීට සාක්ෂි වශයෙන් පාර්ශ්වකරුවන් විසින් මේ ලේඛණයට ද, මෙහි භාවමය සහ දිනයම ඇති තවත් ලේඛණයකටද, වර්ෂ දෙදහස් විසි දෙවැන්නේ................................මස..............................................දින මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී තම තමන්ගේ අත්සන් තබන ලදි.

*මින් පෙර සඳහන් වූ කොන්දේසිවල ගිවිසුම් පඨය*

07. මෙ ගිවිසුම් පත්‍රයේ දක්වා ඇති කර්මාන්තය සඳහා ඒ කර්මාන්තයට සම්බන්ධව සකස් කර ඇති චිත්‍ර සටහන් වල පෙන්වා ඇති සහ ප්‍රමාණ පත්‍රයේ සහ පිරිවිතර වල දක්වා ඇති සියළු අනුෂාංගිකයන් සඳහා අවශ්‍ය වන සියළු ද්‍රව්‍ය සැපයීමෙන් ඒ කර්මාන්තය පරිසමාප්ත කිරිමත්, ප්‍රමාණ පත්‍රයේ නිශ්චිත ලෙස සඳහන් කර ඇති සහ සැපයීමට සේවායෝජකයා විසින් භාරගෙන ඇති යම් ද්‍රව්‍ය, පිරියත, ආම්පන්න, උපකරණ සහ කම්කරුවන් හැර ඒ කර්මාන්තය යථා පරිදි සහ නිසි පරිදි කිරිමට අවශ්‍ය කලින් කල කාර්මික නිලධාරිවරයා විසින් නියම කරනු ලබන අතිරේක වැඩ, අත්හැරිම් සහ වෙනස්කම් සඳහා අවශ්‍ය සියළුම ද්‍රව්‍ය, පිරියත, ආම්පන්න, උපකරණ සහ කම්කරුවන් සැපයිමත් මෙ ගිවිසුමට ඇතුළත් වන කාර්යයක් වන්නේය.කර්මාන්තය සිරිත් පරිදි සහ නිසි ලෙස කිරිම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන හෝ පසුව අවශ්‍ය වන ද්‍රව්‍ය හා කම්කරුවන් පිළිබඳ සියළුම විස්තර චිත්‍ර සටහන් වල දක්වා නොමැති හෝ නිශ්චිත ලෙස සඳහන් කර ලැබ නොමැති වුවත් ඒ විස්තර ඉහත කී ගිවිසුමේ මුදලේ අඩංගු වී තිබෙන ලෙස සැලකනු ලැබිය යුතු ය.



DS Office Medagama

CamScanner

*ප්‍රමාණ පත්‍රය*

08. ගිවිසුම් මුදලේ අඩංගු කර තිබෙන කර්මාන්තයේ ප්‍රමාණය සහ තත්ත්වය මෙ ගිවිසුම් පත්‍රයේ සඳහන් කර ඇති චිත්‍ර සටහන් වල පෙන්වා ඇති සහ / හෝ ප්‍රමාණ පත්‍රයේ දක්වා ඇති සහ / හෝ පිරිවිතරවල විස්තර කරනු ලැබ ඇති ප්‍රමාණය හා තත්ත්වය ලෙස සලකනු ලැබිය යුතු ය.

*ගිවිසුම්කරු විසින් සියල්ල සම්පූර්ණයෙන් සොයා දැන ගතයුතු බව*

09. ගිවිසුම්කරු මෙම ගිවිසුම් පත්‍රය ද මෙහි මින් මතු සඳහන් වන චිත්‍ර සටහන්, ප්‍රමාණ පත්‍රය සහ පිරිවිතරයන් මනාව පරික්ෂා කර තිබෙන බව සලකනු ලැබිය යුතු ය. මේ ගිවිසුම් පත්‍රයේ, ප්‍රමාණ පත්‍රයේ හෝ පිරිවිතරවල යම් කොටසක ඇතුළත් අර්ථය පිළිබඳව ගිවිසුම්කරුට යම් සැකයක් ඇති වුවහොත් එකී සැකය දුරු කර ගැනිම පිණිස ඔහු විසින් මේ ගිවිසුමට අත්සන් තැබීමට පෙර එහි විස්තර සඳහන් කොට ලියවිල්ලකින් එකී විස්තර කාර්මික නිලධාරිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

*පිරිවිතරවලින්, සැලසුම් වලින් අත්හැරීම්*

10. සියළුම වැඩ කොටස් චිත්‍ර සටහන් වල, ප්‍රමාණ පත්‍රයේ සහ පිරිවිතරවල විශේෂයෙන් දක්වා ඇති විටෙක මෙන් ඒ වැඩ කොටස ගිවිසුමේ කොටසක් වන අතර, ඊට ඇතුළත් වන්නේය. තවද,සැලසුම්වල සටහන් නොකර සහ අංශ ඉදිරිපත් නොකර ප්‍රමාණ පත්‍රයේ සහ පිරිවිතරවල පමණක් සඳහන් කර ඇති වැඩ කොටස් එම කර්මාන්තය වෙනුවෙන්ම ඉදිරිපත් කරන ලෙස සැලසුම්වල සහ අංශවල ද විශේෂයෙන් සටහන් කර ඇත්තාක් මෙන් ගිවිසුමේ ඇතුළත් කරනු ලබන්නේය. තවද ප්‍රමාණ පත්‍රය සහ පිරිවිතරවල විස්තර විශේෂයෙන් සඳහන් නොකර හා ඉදිරිපත් නොකර තිබිය හැකි හෙයින් මේ කොන්දේසිවල, චිත්‍ර සටහන්වල, ප්‍රමාන පත්‍රයේ සහ පිරිවිතරවල සත්‍ය අදහස සහ අර්ථය අනුව එක් එක් කොටස නිසි ලෙස පරිසමාප්ත කිරීම සඳහා අවශ්‍ය සියළු වැඩ කොටස් ගිවිසුම්කරු විසින් කළ යුතු බවට පැහැදිළිව තේරුම්ගෙන එසේ අත්හරින ලද සියළු විස්තර ගිවිසුමේ ඇතුළත්වන ලෙස සැලකිය යුතු ය.

*පරස්පරතා*

11. චිත්‍ර සටහන් සහ / හෝ ප්‍රමාණ පත්‍රය සහ / හෝ පිරිවිතර සහ / හෝ කලින් කල තමා වෙත නිකුත්කරනු ලබන උපදෙස් අතර යම් පරස්පරතාවයක් තිබුණහොත් හෝ ඉන් කිසිවක යම් අනුකූලතාවයන්, දෝෂයන් හෝ අත්හැරිමක් තිබුණහොත් ඒ පිළිබඳව පැහැදිළි කිරිම පිණිස ලියවිල්ලකින් එය කාර්මික නිලධාරිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මේ පූර්ව අවවාදය නොසැලකිම නිසා යම් දෝෂයක් ඇතිවුවහොත් ඊට ගිවිසුම්කරු වගකිව යුතු ය. එසේ වුව ද, චිත්‍ර සටහන් සහ / හෝ ප්‍රමාණ පත්‍රය සහ / හෝ පිරිවිතර සහ / හෝ මෙම ගිවිසුමේ වගන්තිවල යම් නියමයන්ට හෝ කොන්දේසි වලට අනුකූලවනතාක් දුරට එකී වගන්ති වලින් චිත්‍ර සටහන් සහ / හෝ පිරිවිතර සහ / හෝ ප්‍රමාණ පත්‍ර අභිභවන බව සැලකිය යුතුය. තවද, යම් අයිතමයක ඇති විස්තරයක් සම්බන්ධව අනුකූලවනතාක් දුරට ප්‍රමාණ පත්‍රයෙන් පිරිවිතර අභිභවන බව සැලකිය යුතු අතර, චිත්‍ර සටහන් වලින්, ප්‍රමාණ පත්‍රය අභිභවන බව සැලකිය යුතුය. කුඩා පරිමාණ සැලසුම්, විශාල පරිමාන සැලසුම් සමඟ අනුකූලවනතාක් දුරට විශාල පරිමාණ සැලසුම් වලින් කුඩා පරිමාණ සැලසුම් අභිභවන බව සැලකිය යුතුය.

*දෝෂයන් පිළිබඳ සියලු වගකීම් ගිවිසුම්කරු භාර ගතයුතු බව*

12. අන්‍යාකාර විධිවිධාන නිශ්චිත වශයෙන් සලස්වා තිබේ නම් හැර, චිත්‍ර සටහන් වලින් සහ / හෝප්‍රමාණ පත්‍රයෙන් සහ / හෝ පිරිවිතර වලින් පැන නගින වගකීම් දෝෂයන් හෝ ඒවා වල අත්හැරීම් පිළිබ ද සියළු වගකීම් ගිවිසුම්කරු භාරගත යුතු ය. ගිවිසුම්කරුගේ ටෙන්ඩරයේ ඇති ගණිතමය හෝ වෙනත් වැරදි පිළිබඳව සේවා යෝජකයා වගකීමක් භාර නොගන්නේ ය.

*ගිවිසුම්කරුට නියමයන් කිරිම*

13. මෙහි ඇතුළත් කර ඇත්නම් හෝ පිරිවිතරවල අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා තිබේ නම් හැර සේවායෝජකයා විසින් ගිවිසුම්කරුට නියමයන් කිරිම හා ගිවිසුම්කරුට උපදෙස් ලබාදීම ලියවිල්ලකින් කළ යුතු ය.

*කර්මාන්ත බිමේ දී වැඩ විෂයයන් කළයුතු බව*

14. යම් නිශ්චිත වැඩ විෂයක් වෙනත් ස්ථානයක ඉටු කිරිමට කාර්මික නිලධාරිවරයාගේ ලිඛිත අනුමැතිය ලබාගෙන තිබේනම් හැර සියළු වැඩ විෂයයන් කර්මාන්ත වැඩබිමේ දී ඉටු කළ යුතු ය.කාර්මික නිලධාරිවරයාගේ එකඟතාවය නොමැතිව කිසිම රාත්‍රියක හෝ සති අන්තයක හෝ රජයේ නිවාඩු දිනවල කර්මාන්තයේ කටයුතු නො කළ යුතු අතර, එසේ කිරිමට අපේක්ෂා කරනු ලබන විට ඔහුගේ කැමැත්ත ලබාගැනිමට හැකිවනු පිණිස ඔහුට ඒ පිළිබඳව ප්‍රමාණවත් දැන්වීමක් කළ යුතු ය. තව ද අධීක්ෂණය සඳහා වසම භාර සංවර්ධන නිලධාරි සම්බන්ධීකරණය කර නිශ්චිත වැඩ පිළිවෙළක් ඔහු විසින් යෙදිය යුතු ය.

*කර්මාන්ත බිමේ සන්තකය සහ ඇතුල්වීම*

15. ස්ථිර කර්මාන්ත සඳහා අවශ්‍ය ඉඩම සහ ඊට ඇතුළත්විමේ අයිතිය සේවා යෝජකයා විසින් ලබා දෙනු ඇත. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර දින 14 ක් ඇතුළත සේවා යෝජකයා විසින් කර්මාන්තය ආරම්භ කිරිම සඳහා අවශ්‍ය කරන බිම් ප්‍රමාණයේ සන්තකය කර්මාන්ත බිමෙන් ගිවිසුම්කරුට දෙනු ලබන



DS Office Medagama

CamScanner

කර්මාන්ත බිමේ කර්මාන්තය ක්‍රියාත්මක වෙන අතරතුර කර්මාන්ත බිමේ ඉතිරි බිම් ප්‍රමාණයේ සන්තකය ගිවිසුම්කරුට කලින් කලට අවශ්‍ය කරන විට ඒ බිම් ප්‍රමාණයේ සන්තකය දෙනු ඇත.එහෙත් සේවායෝජකයා එසේ කිරීම පැහැර හැරියහොත් හෝ අපොහොසත් වුවහොත්, එසේ පැහැර හැරීම හෝ අපොහොසත්වීම හේතුකොට ගෙන ගිවිසුම්කරුට සිදුවීයයි කියනු ලබන යම් පාඩුවක් වෙනුවෙන් හෝ වෙනත් හේතුවක් අලාභ වශයෙන් සේවා යෝජකයාගෙන් යම් මුදලක් ලබා ගැනිමට ගිවිසුම්කරුට අයිතිවාසිකමක් නොලැබේ. එහෙත් එවැනි සියළුම අවස්ථාවලදී කර්මාන්ත පරිසමාප්ත කිරිමේ කාලසීමාව සේවායෝජකයා විසින් තිරණය කරනු ලබන කාලයකින් දිර්ඝ කළ හැකිය. මෙවැනි අවස්ථාවල දි සේවා යෝජකයාගේ තිරණයෙන් ගිවිසුම්කරු බැදෙන්නේ ය.

තත්කාලින වැඩ විෂය සඳහා හෝ වෙනත් යම් එවැනි කාර්යය සඳහා ගිවිසුම්කරුට අවශ්‍ය කරන ඉඩම් තමාගේ ම වියදමින් ගිවිසුම්කරු විසින් සපයාගත යුතු ය. ගිවිසුම්කරු තාවකාලිකව පදිංචිව සිටින යම් ඉඩමක ඇති කර්මාන්ත බිමට ඇතුල්විම සඳහා ඇති අයිතිය ලබා ගැනිම සඳහා ගිවිසුම්කරු විසින් සියළුම වැඩපිලිවෙලවල් සැලැස්විය යුතු අතර, එහි සිටින සියළුම කුලී නිවැසියන්ට වන්දි ද ගෙවිය යුතු ය. තව ද තාවකාලිකව කර්මානත්ය කෙරෙන කර්මාන්තබිමේ හෝ එවැනි වෙනත් ස්ථානයක පෞද්ගලික පාරවල්වලට, කරත්ත පාරවල්වලට, ක්ෂේත්‍රවලට, වතුවලට, වැටවල්වලට සහ කාණුවට හො ඉඩමට සිදුවන අලාභහානි යථා තත්ත්වයට පත්කළ යුතු ය. පාරවල්වලට, අඩි පාරවල්වලට, ඇලවල් ලට, සහ කාණුවලට කිසිම ද්‍රව්‍යයක් නොදැමිය යුතු ය.

විධාන කර ඇති පරිදි කර්මාන්ත බිමට වාහන ඇතුල්විම සඳහා වැඩ පිළිවෙලවල් ගිවිසුම්කරු විසින් සැලැස්විය යුතු අතර ,කාණු උඩින් තාවකාලිකව බෝක්කු තැනීම ද කළ යුතු ය.තව ද නියම කර ඇති පරිදි තිබෙන බිත්ති මැදින් විවර තැනීම ද, තාවකාලික ගේට්ටු දමා එම විවර ආරක්ෂා සහිත බවට පත් කිරිම ද, භූමියට, බිත්තිවලට වෙනත් කිසිවකට සිදුවි ඇති යම් අලාභහානි කාර්මික නිලධාරිවරයා සෑහිමකට පත්වෙන පරිදි යථා තත්ත්වයට පත් කිරිමද ගිවිසුම්කරු විසින් කළ යුතු ය.

*අයුතු ලෙස ඇතුල්වීම*

16. ගිවිසුම්කරු පදිංචිවන ප්‍රදේශය කලින් කල පැහැදිළිව නිශ්චය කරනු ලබන අතර, මේ ප්‍රදේශයතුළ කර්මාන්තය කිරිම සඳහා ගිවිසුම්කරු විසින් සියළුම ඉඩප්‍රස්ථා ලබාදිය යුතුය. තවද ඉන් ඔබ්බට තම මෙහෙයුම් කිරිමට ගිවිසුම්කරුගේ සේවා නියුක්තිකයින්ට තහනම් කළ යුතුය. තවද වෙනත් ඉඩම් වලට අයුතු ලෙස ඇතුල්විම පිලිබඳව හා මේ ගිවිසුම නිසා දේපල වලට සිදුවන අලාභහානී පිළිබඳ ගිවිසුම්කරු වගකිව යුතුය. යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට අනතුරක් සිදුවුවහොත් හෝ දේපලකට අලාභහානි සිදුවුවිට හෝ තුවාලයක් සිදුවුවට ගිවිසුම්කරු විසින් ඒ හේතුකොට ඉදිරිපත් වන සියළුම හිමිකම්පෑම් වලින් සේවායෝජකයා නිදහස් කළ යුතුය. ඒ සම්බන්ධයෙන් යම් මුදලක් ගෙවන ලෙස සේවායෝජකයාට නියම කරනු ලැබුවහොත් එසේ ගෙවන ලද මුදල මේ ගිවිසුම හේතුකොටගෙන ගිවිසුම්කරුට ගෙවන ලද වැය බරක් බවට පත්කළ යුතුය. තවද ඒ ගෙවීම් ගිවිසුම්කරුගේ කැමැත්ත හෝ බලය නොමැතිව කරනු ලැබුවද ගිවිසුම්කරු වෙනුවෙන් ඒ ගෙවිම කිරිමට සේවායෝජකයාට ඇති අයිතිය පිළිබඳව ප්‍රශ්න කිරිමට හෝ එවැනි අයිතියක් ඇති බව පිළි නොගැනිමට ගිවිසුම්කරුට අයිතියක් නැත.

*අණපනත් සහ අණ නියෝග*

17. කර්මාන්තයට අදාළව ගිවිසුම්කරු විසින් කළ යුතු යම් කර්මාන්තයකට බලපාන යම් පනතක ඇති සියළුම විධිවිධාන ගිවිසුම්කරු විසින් පිළිපැදිය යුතු අතර, යම් නගර සභාවක් හෝපළාත් පාලන ආයතනයක් හෝ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිත්‍යානුකූලව පවරා ඇති කොන්දේසි ගිවිසුම්කරුගේ වියදමින් පිළිපැදිය යුතුය. තවද එම ගාස්තුවක් වේ නම් එම සියළුම ගාස්තු ගිවිසුම්කරු විසින් ඒ ආයතනවලට ගෙවිය යුතු ය.

*වැටවල් බැදිම, ආලෝක කිරිම සහ මුර කිරිම*

18. කර්මාන්තය ඉදිකරනු ලබන හෝ ක්‍රියාත්මක වෙමින් පවතින මුළු කාලය තුළ ගිවිසුම්කරු විසින් ජිවිත හා දේපළ ආරක්ෂාව සඳහා වැටවල්, බාධක, අලෝක ක්‍රම, මුරකරුවන් සහ වෙනත් අවශ්‍ය පූර්වාරක්ෂක වැඩපිළිවෙලවල් සැපයිමෙන් සහ සැලසිමෙන් හැකි සෑම පරිදිම ආරක්ෂාව සැලසිය යුතු අතර, එවැනි පූර්වාරක්ෂක වැඩපිළිවෙලවල් සැලසිම නො සලකා හැරිමෙන් හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ සිදුවන සියළු අනතුරු සහ අලාභහානි ගැන ගිවිසුම්කරු වගකිව යුතු ය.

*ඇල මාර්ගසහ සහ ජලාශ අපවිත්‍ර කිරිම*

19. මිනිසුන්ට, සතුන්ට හෝ මත්ස්‍යයින්ට හෝ පැලැටි වලට හානි සිදුවිය හැකි අන්දමින් උල්පත්, ඇල මාර්ග සහ ජලාශ අපවිත්‍ර නොවන පරිදි ඒවා නිසිලෙස ආරක්ෂා කිරිම සඳහා ගිවිසුම්කරු හැකි සියළුම පූර්වාරක්ෂක වැඩපිළිවෙලවල් යෙදිය යුතු ය.

*ද්‍රව්‍ය සහ කර්මාන්තය ආරක්ෂා කිරිම*

20. ගිවිසුම්කරු විසින්,

(අ) ද්‍රව්‍ය ගබඩාකර තැබීම පිණිස සහ ඒවා ආරක්ෂා කර ගැනිම පිණිස නියම කර ඇති පරිදි සහ විධාන කළ විට රැලි ගැසුණු යකඩ තහඩු වලින්, පොල්අතු වලින් හෝ වෙනත්අනුමත ද්‍රව්‍ය වලින් අව් වැසි වලට ඔරොත්තු දෙන මඩු තැනිය යුතු අතර, ගිවිසුම පරිසමාප්ත වූ විට ඒවා සම්පූර්ණයෙන්ම ඉවත් කළ යුතු ය.



DS Office Medagama

CamScanner

( ආ ) තව ද සියළු කර්මාන්ත අව්වෙන් හෝ වැස්සෙන් ආරක්ෂාවීම පිණිස සුදුසු ආවරණ යෙදිය යුතු ය.

( ඇ ) තවද කර්මාන්ත ක්‍රියාත්මක වෙන අතරතුර පරිසමාප්ත කරන ලද කර්මාන්ත වලට හානි නොවන පරිදි ඒවා ආරක්ෂා කර ගත යුතු ය.

***තාවකාලික ගොඩනැගිලි සහ කර්මාන්ත ඉවත් කිරීම***

21. ගිවිසුම්කරු විසින් ඉදිකරන ලද තාවකාලික ගොඩනැගිල්ල සහ / හෝ තාවකාලික කර්මාන්ත සියල්ල ඉවත් කරන ලෙස කාර්මික නිලධාරිවරයා විසින් නියම කරන ලද විට ගිවිසුම්කරු විසින් එසේ ඒ සියල්ල ඉවත් කළ යුතු අතර, සියළුම තාවකාලික පාරවල් සහ මාර්ග වැසිය යුතුය. තවද ඔහු විසින් කර්මාන්තයට යොදා ගැනිමට අදහස් කර තිබුණු සියළු පිරියත සහ අතිරික්ත ද්‍රව්‍යසේවායෝජකයාගේ හෝ සෙසු තැනැත්තන්ගේ දේපලවලින් ඉවත් කළ යුතුය. තවද, ගිවිසුම්කරු විසින් එක් එක් තාවකාලික ගොඩනැගිලි හෝ පාරවල් පිහිටි ස්ථානය හෝ ස්ථාන කාර්මික නිලධාරිවරයා සැහිමකට පත්වන පරිදි සමතලා කළ යුතු අතර, එම ස්ථානය හෝ ස්ථාන මුලින් තිබූ තත්ත්වයට පත් කළ යුතුය.

***අතිරික්ත ද්‍රව්‍ය සහ සුන්බුන් ඉවත් කිරීම සහ ඉතිරිවන ද්‍රව්‍ය ආපසු භාරදීම***

22. අතිරික්ත ද්‍රව්‍ය සහ සුන්බුන් ඉවත් කරන තුරු වැඩ <u>***අවසන් කිරීමේ වර්තාව***</u> නිකුත් කරනු නො ලැබේ.ගිවිසුම්කරු විසින් ගිවිසුම්කරුගේ ම වියදමින් හැකිතාක් ඉක්මණින් සියළු අතිරික්ත ද්‍රව්‍ය සුන්බුන් සහ කුණු කසල ඉවත් කළ යුතු අතර, සෑම විටම කාර්මික නිලධාරිවරයා විසින් විධාන කරනු ලබන පරිදි කර්මාන්ත බිම සහ ඒ අවට ඉතා පවිත්‍ර සහ යෝග්‍ය තත්ත්වයෙන් පවත්වාගෙන ගොස් අවසානයේ දී ද ඒ තත්ත්වයෙන් ම තැබිය යුතු ය. කාර්මික නිලධාරි විසින් කර්මාන්තය ඉටු කිරීම පිණිස නිකුත් කරනු ලබන සියළුම ද්‍රව්‍ය රජයේ දේපලක් වන අතර, භාවිතයෙන් පසු ඉතිරිවන සියළු ම දෑ විධිමත් පරිදි ඉංජිනේරු වෙත ගිවිසුම්කරුගේ වියදමින් ප්‍රවහනය කර නැවත භාරදිය යුතු ය. කර්මාන්තය ඉටුකිරිමේ දී ඉංජිනේරු විසින් විධානය කරනු ලබන පරිදි කර්මාන්තය අවසානයේ දී ඉතිරිවන ද්‍රව්‍ය ගිවිසුම්කරුගේ වියදමින් භාර ප්‍රවහනය කර භාරදිය යුතු ය.

***කර්මාන්තය විදහා දැක්වීම ඒ සඳහා කම්කරුවන් සහ උපකරණ සැපයීම***

23. ඉංජිනේරු විසින් සපයන ලද චිත්‍ර සටහන්වලට අනුව ගිවිසුම්කරු විසින් තම වියදමින් කර්මාන්තය විදහා දැක්විය යුතු අතර, සිදුවන යම් දෝෂයක් සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය. තවද සාවද්‍ය ලෙස විදහා දැක්වීමෙ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන යම් යම් දෝෂ තමාගේ වියදමින් නිරවද්‍ය කළ යුතු ය. සියළුම විදහා දැක්වීම් පරික්ෂා කිරිමට කාර්මික නිලධාරිවරයාට බලය ඇති නමුත් රේඛා සහ මට්ටම් සම්බන්ධයෙන් ගිවිසුම්කරු හුදෙක් වගකිව යුතු ය. තව ද කාර්මික නිලධාරිවරයා විසින් විධාන කරනු ලැබුවහොත්, ගිවිසුම්කරු විසින් අවශ්‍ය සියළු ම කම්කරුවන්, උපකරණ සහ වෙනත් අයිතමයන් සොයාගත යුතු ය. තව ද එහි විදහා දැක්වීම කාර්මික නිලධාරිවරයා විසින් පරික්ෂාකර බැලීම සඳහා අවශ්‍ය කරන එළිපෙහෙළි කිරිම ගිවිසුම්කරු විසින් සිදු කළ යුතු ය.

***කර්මාන්තයේ අනුපිළිවෙල තිරණය කිරිමට ඇති බලය***

24. කාර්මික නිලධාරිවරයා ලියවිල්ලකින් විධානය කරනු ලබන පරිදි ගිවිසුම්කරු විසින් කර්මාන්ත බිමේ ඇතැම් කොටස්වල වැඩ විෂය ආරම්භ කළ යුතු අතර, එය කර්මාන්තය ක්‍රියාත්මක කළ යුතු අනුපිළිවෙළ අනුව ම විය යුතු ය. කිසිම ආකාරයකින් ගිවිසුමට පටහැනි නොවන පරිදි අවශ්‍ය යැයි කාර්මික නිලධාරිවරයා සලකන ආකාරයෙන් කලින් කල කර්මාන්තයේ හෝ ඉන් කොටසක හෝ අනුපිළිවෙල වෙනස් කළ හැකිය. තව ද එකී උපදෙස් ලැබීමෙන් පසුව ගිවිසුම්කරු විසින් එසේ විධාන කරන ලද අනුපිළිවෙළ අනුව ක්‍රියාකළ යුතු ය. තව ද කර්මාන්තයේ අනුපිළිවෙළ වෙනස් කිරිම නිසා සිදුවන යම් අලාභයක් වෙනුවෙන් හිමිකම් කීමට ගිවිසුම්කරුට අයිතිවාසිකමක් නොමැත.

***කර්මාන්තය අත්හිටුවීම***

25. කිසිම ආකාරයකින් මෙම ගිවිසුමට පටහැනි නොවන පරිදි කාර්මික නිලධාරිවරයා විසින් කලින් කල ලිඛිතව කරනු ලබන විධානයක් මගින් කර්මාන්තය හෝ ඉන් යම් කොටසක් හෝ අත්හිටුවන ලෙසට ගිවිසුම්කරුට විධාන කළ හැකි ය. එකී ලිඛිත නිවේදනය ලැබීමෙන් පසු නැවත කර්මාන්තය හෝ එම කොටස ආරම්භ කරන ලෙස ලිඛිතව නිවේදනයක් හෝ අවසරයක් කාර්මික නිලධාරිවරයාගෙන් ලැබෙනතුරු එසේ අත්හිටුවන ලද කර්මාන්තය හෝ එම කොටස ගිවිසුම්කරු විසින් ආරම්භ නො කළ යුතු ය. එසේ අත්හිටුවීම නිසා යම් අලාභයක් වෙනුවෙන් හිමිකම් කීමට ගිවිසුම්කරුට අයිතිවාසිකමක් නොමැත.

***ස්වාභාවික හේතුන් නිසා සිදුවන ප්‍රමාද***

26. යම්කිසි ස්වාභාවික හේතුවක් නිසා හෝ අසාමාන්‍ය අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා හෝ වෙනත් යම් නොවැලැක්විය හැකි හේතුවක් නිසා කර්මාන්තය ප්‍රමාදවිය හැකි බව ගිවිසුම්කරු විසින් කාර්මික නිලධාරිවරයාට පෙන්වා දීම නිසා හෝ වෙනත් ආකාරයකින් ඒ බව පෙනීයාම නිසා එසේ ප්‍රමාදවිය හැකි බව කාර්මික නිලධාරිවරයාගේ මතය වන අවස්ථාවක කාර්මිකනිලධාරිවරයා විසින් ලිඛිතව එම කර්මාන්තය ක්‍රියාත්මක කිරිම සඳහා ගිවිසුම්කරුට සාධාරණ කාලයක් දිය හැකි ය. එසේ වුවත් ප්‍රමාද වැළැක්වීම සඳහා ගිවිසුම්කරු විසින් නිතරම දැඩි උත්සාහයක් දැරිය යුතු අතර, කර්මාන්තය අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය සියළුම දේ කාර්මික නිලධාරිවරයා සැහිමකට පත්වන පරිදි කළ යුතු ය.



DS Office Medagama

CamScanner

**සියලුම සපයා ගැනීම් තමන් විසින් ම සපයා ගතයුතු බව**

27. වෙනත් ආකාරයකින් නියමයක් කර තිබේ නම් හැර ගිවිසුම්කරු විසින් කර්මාන්තය විධිමත් ලෙස කිරීම සඳහා අවශ්‍ය කරන සියළුම වර්ගයේ තාවකාලික හා ස්ථිර කම්කරුවන්, ආයුධ, ආම්පන්න, යන්ත්‍රෝපකරණ, උපකරණ, සහ ද්‍රව්‍ය තමන්ගේ වියදමින් තමන් විසින් සපයාගත යුතු අතර, එම කර්මාන්තය සඳහා, එම කර්මාන්තය කිරීම සඳහා පමණක් නොව කර්මාන්තයට යාබදව ඇති පාරවල්, ක්ෂේත්‍ර ඉවුරු, හා පවු මාවත් භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සඳහා ද යාබදව ඇති කර්මාන්තයට අදාළ පොදු දේපල හා ගොඩනැගිලි සහ ඒවායේ ආරක්ෂාව සඳහා ද අවශ්‍ය කරනු ලබන සියළුම කොන්ක්‍රීට් පෙට්ටි, රාමු ගැසීම, පලංචි, වේදිකා, ලෑලි ගැසීම, කුරුපා ගැසීම, මුක්කු ගැසීම, පොම්ප සවිකිරීම, වැටවල් ගැසීම, දැන්වීම් ප්‍රදර්ශනය කිරීම, මුරසේවා සැපයීම, දිවා රාත්‍රී තාවකාලික විදුලිබලය සම්පාදනය ආදිය ගිවිසුම්කරු විසින් ඉටුකළ යුතුය. තවද අවශ්‍ය වූ විට හා එසේ කරන ලෙස නියම කරන ලද විට ගිවිසුම්කරු විසින් එකී සියළු කොන්ක්‍රීට් පෙට්ටි, රාමු ගැසීම, පලංචි, වේදිකා, ලෑලි ගැසීම, කුරුපා ගැසීම, මුක්කු ගැසීම, පොම්ප සවිකිරීම, වැටවල් ගැසීම, දැන්වීම් ප්‍රදර්ශනය කිරීම, මුරසේවා සැපයීම, දිවා රාත්‍රී තාවකාලික විදුලිබලය සම්පාදනය ගලවා ඉවත් කළ යුතු අතර, කර්මාන්තය සිදුකරන අතරතුර ඉවත් කිරීමට සිදුවූ සියළු ද්‍රව්‍ය හා දේ ඉංජිනේරු සෑහීමට පත්වන පරිදි ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ ඒවා සඳහා අලාභ පියවීමද කළ යුතු ය.

**යොදාගෙන ඇති ක්‍රමවල ප්‍රමාණවත් බව**

28. මෙම ගිවිසුම ඉටුකිරීම සඳහා යොදාගනු ලබන කොන්ක්‍රීට් පෙට්ටි ගැසි,රාමු ගැසීම,පලංචි,වේදිකා ලෑලි ගැසීම, යන්ත්‍රෝපකරණ, කාණු, ආයුධ, පොම්ප, පිරියත හෝ උපකරණ ආදියේ සහ කාර්මික නිලධාරිවරයා විසින් අනුමත කරන ලද හෝ නිර්දේශ කරන ලද හෝ එසේ නොකරන ලද සියළු ක්‍රමවල ප්‍රමාණවත් බව ගැන ගිවිසුම්කරු සම්පූර්ණ වගකීම භාරගත යුතු අතර, ගිවිසුම පරිසමාප්ත කරනු ලබනතුරු කවර හෝ හේතුවක් නිසා ඇතිවන අනතුරු හෝ අලාභ පිළිබඳව සියළු වගකීම් ගිවිසුම්කරු භාරගත යුතු ය.

**ද්‍රව්‍ය හා පිරියත ඉවත් නො කළ යුතු බව**

29. කර්මාන්තය ඉදිකිරීමෙහිලා, පරිසමාප්ත කිරීමෙහිලා හෝ නඩත්තු කිරීමෙහිලා කර්මාන්තයටහෝ කර්මාන්තබිමට ගිවිසුම්කරු විසින් ගෙනෙන ලද යම් ද්‍රව්‍ය ගිවිසුම්කරු විසින් කර්මාන්තයෙන් හෝ කර්මාන්ත බිමෙන් ඉවත් කිරීමට තැත් කිරීම නොකළ යුතුය. තවද, කාර්මික නිලධාරිවරයාගේ පූර්ණ ලිඛිත අවසරය රහිතව කර්මාන්තය ඉදිකිරීම පිණිස, කර්මාන්තය පරිසමාප්ත කිරීම පිණිස හෝ නඩත්තු කිරීම පිණිස එහි තබන ලද යම් පිරියතක් හෝ වෙනත් තාවකාලික කර්මාන්ත ඔහු විසින් ඉවත් කිරීම හෝ ගිවිසුම්කරු විසින් කර්මාන්ත බිමෙන් ඉවත් කළහොත් හෝ ඉවත් කිරීමට තැත් කළහොත් ගිවිසුම්කරු මෙම වගන්තිය උල්ලංඝණය කරනු ලබන බවට ඉංජිනේරුවරයා විසින් ලිඛිතව සහතික කළ හැකිය. තවද, ගිවිසුම්කරු විසින් කර්මාන්තයෙන් හෝ කර්මාන්ත බිමෙන් යම් ද්‍රව්‍ය පිරියත හෝ තාවකාලික කර්මාන්ත කර්මාන්ත බිමෙන් ඉවත් කරනු ලබන බවට සහ මෙම වගන්තිය කඩකර ඇති බවටත්, මෙම ගිවිසුම කඩකර ඇති බවටත් ඉංජිනේරුවරයාගේ ලිඛිත සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක වන්නේය.තවද, ගිවිසුම පරිසමාප්ත කිරීම ගිවිසුම්කරු පැහැර හැරියහොත් එකී සියළු ද්‍රව්‍ය පිරියත හෝ තාවකාලික කර්මාන්ත සේවායෝජකයාගේ දේපලක් බවට පත්වන අතර, ගිවිසුම්කරුගේ පොල්මක්කරුවන්ගේ, අද්මිනිස්ත්‍රාසිකරුවන්ගේ හෝ නිත්‍යානුකූල නියෝජිතයින්ගේ සියළු හිමිකම් හා ඉල්ලීම් වලට එරෙහිව එම දේපල ළඟතබා ගැනීමට, පාවිච්චි කිරීමට සේවායෝජකයාට අයිතිවාසිකම් ඇත්තේ ය.

**කර්මාන්තයේ නිමාවේ තත්ත්වය**

30. ගිවිසුම බලපවත්නා කාලය තුළ කර්මාන්තයේ නිමාව ඉහළම තත්ත්වයේ තිබිය යුතු අතර, කාර්මික නිලධාරිවරයා සෑහීමට පත්වන පරිදි සතුටුදායක ලෙස අවසන් කළ යුතු ය. තමාගේ මතය අනුව සතුටුදායක ලෙස කර නැති කර්මාන්තයේ ඕනෑම කොටසක් කාර්මික නිලධාරිවරයාසෑහීමට පත්වන පරිදි ගිවිසුම්කරුගේ වියදමින් ඉවත් කරන ලෙස සහ නැවත නිසි පරිදි ඉදිකරන ලෙස විධාන කිරීමට කාර්මික නිලධාරිවරයාට බලය ඇත්තේ ය. කාර්මික නිලධාරිවරයාගේ ලිඛිත විධානයක් ලැබී දින 07 ක් ඇතුළත එකී නිවැරදි කිරීමක් සිදු කිරීමට ගිවිසුම්කරු පැහැර හැරියහොත් හෝ අපොහොසත් වුවහොත් වඩාත් සුදුසුයැයි තමා සලකනු ලබන ආකාරයෙන් එම කර්මාන්තය කිරීමට කාර්මික නිලධාරිවරයාට බලය අයිතිවාසිකම තිබෙන අතර, ගිවිසුම්කරුට එවකට අය විය යුතු යම් මුදල් වලින් එකී කර්මාන්තය සඳහා ගිය වියදම් අඩුකර ගැනීමකට හෝ නීති මගින් වියදම අයකර ගැනීමට ඔහුට බලය සහ අයිතිවාසිකම ඇත්තේ ය. කාර්මික නිලධාරිවරයා පැමිණි සිටීම හා කාර්මික නිලධාරිවරයා අධීක්ෂණය කිරීම නිසා කර්මාන්තයේ යම් කොටසක තත්ත්වය පිළිබඳ ගිවිසුම්කරු දැරියයුතු වගකීමෙන් ඔහු නිදහස් නො වන්නේ ය. ව්‍යාපෘතිය භාර කාර්මික නිලධාරිවරයාගේ උපදෙස්වලට පටහැනිව කරන ලද කර්මාන්ත කොටස් සඳහා ගෙවීම් නොකළ යුතු අතර, ඒ කර්මාන්තය සඳහා හිමිකම් පෑමට ගිවිසුම්කරුට නොහැකිවනු ඇත.

**කර්මාන්තයේ නිවරදාභාවය පිළිබඳ වගකීම**

31. තමා විසින් ඉටු කරන ලද කර්මාන්තයේ නිවැරදිභාවය සහ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් ගිවිසුම්කරු සම්පූර්ණයෙන් ම වගකිව යුතු අතර, ඒ පිළිබඳ ඇතිවන යම් යම් ගැටළු සහගත තත්ත්වයන් නිසා සිදුවන වැරදි හෝ අලාභ තම වියදමින් ගිවිසුම්කරු විසින් ඉවත්කිරීම, අලාභ පියවීම හෝ ඒවා නිවැරදි කිරීම කළ යුතුය.කර්මාන්තය කරනු ලබන අතරතුර ගිවිසුම්කරු විසින් භාවිතා කරනු ලබන හෝ යොදාගනු ලබන ද්‍රව්‍ය හෝ ඉදිකිරීම් ක්‍රම කාර්මික නිලධාරිවරයා විසින් අනුමත කිරීම නිසා ඉදිකිරීම්



DS Office Medagama

CamScanner

කරනු ලබන අතරතුර හෝ වගකිම් කාලය තුළ එකී කර්මාන්තයේ දෝෂයන් මතුවුවහොත් ඉන් ගිවිසුම්කරු නිදහස් නොවන්නේ ය.

*ද්‍රව්‍යවල ගුණාත්මක බව*

32. අදාළ හොඳම ද්‍රව්‍ය යොදා කාර්මික නිලධාරිවරයා සෑහිමකට පත්වන පරිදි කර්මාන්තය නිමකළ යුතුය. කර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන ද්‍රව්‍ය වල තත්ත්වය සෑමවිටම කාර්මික නිලධාරිවරයා විසින් තිරණය කළ යුතු අතර, කාර්මික නිලධාරිවරයා විසින් භාවිතා කරනු ලබන ද්‍රව්‍ය හැර වෙනත් ද්‍රව්‍ය භාවිතා නොකළ යුතුය. මෙවැනි කටයුතු වලදී කාර්මික නිලධාරිවරයාගේ තිරණය අවසානාත්මක වන්නේය. කාර්මික නිලධාරිවරයා විසින් ඉල්ලා සිටනු ලැබුවහොත් කර්මාන්තය සඳහා ගෙනෙන ලද ද්‍රව්‍ය තොග සම්බන්ධයෙන් කුවිතාන්සි, වවුචර්, ඉන්වොයිස්, සහතික කළ වෙනත් ලේඛන ගිවිසුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. එම ද්‍රව්‍යවල ගුණාත්මකභාවය එම සියළු ලේඛන වලින් කාර්මික නිලධාරිවරයා සෑහිමකට පත්වන පරිදි ඔප්පු විය යුතුය.යම් යම් ද්‍රව්‍යයන් චිත්‍ර සටහන් වලට සහ / හෝ පිරිවිතරයනට පටහැනි යැයි හෝ යම් ද්‍රව්‍ය යම් අකාරයකින් එම චිත්‍ර සටහන් වලට හෝ පිරිවිතරවල සඳහන් තත්ත්වයනට වඩා බලයැයි කාර්මික නිලධාරිවරයාට පෙනිගිය අවස්ථාවක එම ද්‍රව්‍ය කර්මාන්තයෙන් ඉවත් කළ යුතු අතර, එසේ කිරිමට කාර්මික නිලධාරිවරයාගේ ලිඛිත උපදෙස් මත වහාම එම ද්‍රව්‍ය කර්මාන්තයෙන් ගලවා කර්මාන්ත බිමෙන් ඉවත් කළ යුතුය. එසේ ගලවන ලද ද්‍රව්‍ය සඳහා ගිවිසුම්කරුගේ තනි වියදමෙන් කාර්මික නිලධාරිවරයා සෑහිමකට පත්වන පරිදි අලාභ පියවිය යුතුය.

*නිරික්ෂණය*

33. කාර්මික නිලධාරිවරයාගේ අනුමැතියකින් තොරව කර්මාන්තයක් වසා නොදැමිය යුතු ය. එසේ අනුමැතිය නොමැතිව වසා දමනු ලබන කර්මාන්තයක් කාර්මික නිලධාරිවරයාට අවශ්‍ය වූ අවස්ථාවක විවෘත කළ හැකි අතර, ඒ නිසා ඇතිවන යම් ප්‍රමාදයන් හෝ අලාභයක් හෝ කළයුතු අතිරේක වැඩ විෂයයන් නිසා දරන්නට වන වියදම් ගිවිසුම්කරු විසින් දැරිය යුතුය. ගිවිසුම ඉටු කරනු ලබන කාලය තුළ හෝ ගිවිසුමේ කාලය අතරතුර යම් වැඩ විෂයයක් අයෝග්‍ය අන්දමින් ඉටු කර ඇති බව තිරණය කිරිමට කාර්මික නිලධාරිවරයාට හේතු තිබේනම්, ඔහුට එම කර්මාන්තය පරික්ෂා කර බැලිය හැකිය. තවද ඒ පරික්ෂණය කිරිමට හැකිවන පරිදි යම් වැඩ විෂයයන් හෝ ද්‍රව්‍ය කඩා දමන ලෙස හෝ විවෘත කරන ලෙස හෝ ඉවත් කරන ලෙස ගිවිසුම්කරු වෙත නියම කිරිමටද හැකියාව ඇත. එසේ කරන ලද පරික්ෂණයක දී ද්‍රව්‍ය සම්බන්ධයෙන් හෝ කර්මාන්තයේ නිමාව සම්බන්ධයෙන් හෝ යම් දෝෂ තිබෙන බව පෙනි ගිය හොත් එකී පරික්ෂණය පිළිබඳ සියළු වියදම් ගිවිසුම්කරු විසින් දැරිය යුතු ය. කාර්මික නිලධාරිවරයා සෑහීමකට පත්වන පරිදි ගිවිසුම්කරු විසින් තම වියදමින් එකී දෝෂයන් නිදොස් කර කර්මාන්තය සම්පූර්ණ කළ යුතුය. එවැනි දෝෂ තිබෙන බව පෙනී ගිය හොත් එකී පරික්ෂණයේ වියදම් සේවා යෝජකයා විසින් දැරිය යුතුය. එමෙන්ම ගිවිසුම්කරුගේ කර්මාන්ත බිමේ හෝ වෙනත් ස්ථානයක හෝ රැස්කර ඇති කර්මාන්තයට අදාළ ද්‍රව්‍ය සහ කර්මාන්තය පරික්ෂා කර බැලිමට ඔහුගේ බලයලත් නියෝජිතයින්ට සියළු විට සහසුකම් සම්පාදනය කළ යුතු ය.

*ගිවිසුම්කරුගේ නියෝජිතයින්*

34. ගිවිසුම්කරු විසින් කර්මාන්තය නිරන්තරයෙන් හා සම්පූර්ණ කාලය යොදවා අධික්ෂණය කිරිම පිණිස, කාර්මික නිලධාරිවරයාගේ උපදෙස් ලබාගෙන ඒවා ක්‍රියාත්මක කිරිම පිණිස හො ගිවිසුම්කරු වෙනුවෙන් යම් දැන්වීමක් හෝ දැන්වීම් භාර ගැනීමට, තමාගේ විධිමත් අධික්ෂණ නියෝජිතයා වශයෙන් තම වෙනුවෙන් ක්‍රියාකිරිමට බලය දුන් නිපුන කළමනාකරුවෙක් සේවයේ නියුක්ත කළ යුතු ය. එකී නියෝජිතයාගේ නම ලිඛිතව කාර්මික නිලධාරිවරයාට හා සේවායෝජකයා වෙත දැන්විය යුතුය.එහිදි ගිවිසුම්කරුගේ නියෝජිතයා සේවය සඳහා නොපැමිණි අවස්ථාවක සිදුවන වරදකින්, අනතුරකින්, උවදුරකින් හෝ ප්‍රමාදයකින් පැන නගින යම් වගකිමක් හෝ කර්මාන්තය ආරක්ෂිත අන්දමින් හෝ සතුටුදායක අන්දමින් ඉටු කිරිමේ වගකිමෙන ගිවිසුම්කරු නිදහස් නොවන්නේය.මෙම නියෝජිතයාට මෙවැනි කර්මාන්ත ඉටු කිරිම සම්බන්ධයෙන් පූර්ණ පළපුරුද්දක් තිබිය යුතු අතර, කර්මාන්තයේ පරිසමාප්ත සහතිකය නිකුත් කිරිමට පෙර නියෝජිතයාගේ සේවා නියුක්තයි අවසන් නොවිය යුතු ය.

*දැන්විම් භාර දීම*

35. ගිවිසුම්කරු වෙත භාර දෙනු ලබන සියළු දැන්වීම් ඔහු වෙත පෞද්ගලිකව ගෙනගොස් දෙනු ලැබුවහොත් හෝ ඔහුගේ නියෝජිතයාට භාරදෙනු ලැබුවහොත් හෝ තම කාර්යාලයට හෝ නිවසට තැපැලෙන් යවනු ලබුවහොත් එම දැන්විම ගිවිසුම්කරු වෙත භාරදෙනු ලැබූ දැන්වීමක් ලෙස සලකනු ලැබේ. තවද ගිවිසුම්කරු තම කාර්යාලය හෝ නිවස වෙනස් කළ හොත් ඔහු විසින් එකී වෙනස ලිඛිතව කාර්මික නිලධාරිවරයාට දැනුම් දිය යුතු බව තව දුරටත් ප්‍රකාශිතව එකඟවන අතර, එම දැන්විම කාර්මික නිලධාරිවරයා වෙත යවනු ලබන තුරු මෙහි සපයා ඇති ලිපිනයට සියළුම ලිපි, දැන්වීම් හෝ වෙනත් ලේඛන ප්‍රමාණවත් පරිදි භාරදීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

*ගිවිසුම් අතුරු බදුදීම*

36. මෙම ගිවිසුම යටතේ ගිවිසුම්කරුගේ බැඳීම් සහ අයිතිවාසිකම් සේවා යෝජකාගෙන් කලින් ලියවිල්ලකින් ලබාගත් කැමැත්ත සහ බලය රහිතව වෙනත් කෙනෙකුට පැවරිම අන්‍යාකාරයකින් හැරවීම හෝ අතුරු බදුදිම නොකළ යුතු ය.



DS Office Medagama

CS CamScanner

නිදහස් කිරීමේ බලය

37. ගිවිසුම්කරු විසින් කර්මාන්තය සඳහා සේවයේ නියුක්ත කරන ලද යම් තැනැත්තෙකු අකාර්යක්ෂම යැයි කාර්මික නිලධාරිවරයාගේ මතය වුවහොත් සහ ඒ තැනැත්තා නොහිසි ආකාරයෙන් ක්‍රියාකළ හොත් කාර්මික නිලධාරිවරයාගේ ඉල්ලීම පිට ගිවිසුම්කරු විසින් ඔහු කර්මාන්තයෙන් නෙරපිය යුතු ය. එමෙන් ම එම තැනැත්තා කාර්මික නිලධාරිවරයාගේ ලිඛිත අවසරයකින් තොරව නැවත සේවයේ නියුක්ත නොකළ යුතු ය.

ලංකාවේ කම්කරුවන් සේවයේ සේවයේ නියුක්ත කළ යුතු බව

38. කර්මාන්තය ඉටු කිරීමේ දී ශ්‍රී ලංකාවේ පුහුණු සහ නුපුහුණු කම්කරුවන් පමණක් සේවයේ නියුක්ත කිරීමට ගිවිසුම්කරු මෙයින් එකඟ වන අතර, හැකිතාක් දුරට කර්මාන්තය ඉටු කරනු ලබන ප්‍රදේශයෙන් ම මෙම කම්කරුවන් බඳවාගත යුතු ය. කම්කරුවන්ට වැටුප් ගෙවීමට අදාළව දැනට බලපවත්වන හෝ මින්මතුවට බලපැවැත්විය හැකි සියළු නියෝග අනුව සාධාරණ වේතනයක් ගෙවනු ලබන බවට ගිවිසුම්කරු මෙයින් එකඟ වන්නේ ය.

කම්කරුවන්ගේ වන්දි ඉල්ලීම්

39. සංශෝධිත කම්කරු ආඥාපනත යටතේ ගිවිසුම්කරුගේ යම් සේවා නියුක්තියක් සම්බන්ධයෙන් හෝ යම් සේවා නියුක්තිකයෙකු ඉදිරිපත් කර ඇති හිමිකමක් සම්බන්ධයෙන් ගිවිසුම්කරු විසින් සේවා යෝජකයාට හානි පූර්ණය කළ යුතු ය. සේවා යෝජකයා විසින් එවැනි හිමිකම්පෑමක් මේ ගිවිසුමේ නියමයන් යටතේ හෝ වෙනත් ආකාරයකින් හෝ ගිවිසුම්කරුට අයවිය යුතු යම් මුදලකින් සහ/ හෝ මේ ගිවිසුමේ තුන්වන වගන්තිය යටතේ ගිවිසුම්කරු විසින් තැන්පත් කරන ලද රුපියල් ........................................................................................................................මුදලින් අඩු කිරීම සහ / හෝ නීති මගින් ගිවිසුම්කරුගෙන් අයකර ගැනීමට සේවායෝජකයාට බලය පැවරෙන්නේ ය.

අනතුරු සහ අලාභ

40. ගිවිසුම්කරු විසින් හෝ සේවායෝජකයා විසින් හෝ වෙනත් තැනැත්තෙකු විසින් හෝ යම් පුද්ගලයෙක් සේවයේ නියුක්ත කර ඇති අවස්ථාවක ඒ පුද්ගලයා හෝ පොදු හෝ පෞද්ගලික මාර්ග වලට, දේපල වලට, කර්මාන්තයේ ද්‍රව්‍ය වලට, බඩු වලට හෝ වෙනත් දේවලට එකී කර්මාන්තයෙන් හෝ ඊට සම්බන්ධ යම් කිසිවෙකින් අලාභයක්, කරදරයක් හෝ හානියක් සිදුවුවහොත් ගිවිසුම්කරු එකී සියළු අලාභ වලට, කරදර වලට, හෝ හානි වලට වගකිව යුතු අතර, ඒ සම්බන්ධයෙන් පවරනු ලබන හෝ ඉදිරිපත් කරනු ලබන සියළු නඩු හිමිකම් පෑම්, අලාභ ඉල්ලීම්, නඩු ගාස්තු ඉල්ලීම් හෝ වියදම් සඳහා අලාභ පියවීම හෝ ඒවා සමථයකට පත් කිරීම ඔහු විසින් කළ යුතු ය. තවද සේවායෝජකයා සහ ඔහුගේ සෑම නිලධාරියෙක්ම හෝ සේවකයෙක්ම හිමිකම්පෑම් වලින් නිදහස් කිරීම හෝ ඔහුට හානි පූර්ණය කිරීම කළ යුතු ය. එහි කාර්ය පටිපාටිය සඳහා වියදම් සහ ගාස්තු සහ ගෙවන ලද මුදල් මෙම ගිවිසුමේ නියමයන් යටතේ හෝ අන්‍යාකාරව හෝ ගිවිසුම්කරුට අයවිය යුතු හෝ මින් අයවිය යුතු යම් මුදලක් අඩු කර ගැනීමට මෙම ගිවිසුමේ තුන්වන වගන්තිය යටතේ ගිවිසුම්කරු විසින් තැන්පත් කර ඇති රුපියල් ........................................................................................................................මුදලින් අඩු කර ගැනීමට සේවායෝජකයාට බලය පැවරෙන්නේ ය.

රක්ෂණය

41. කර්මාන්තය කිරීමේ දී භාවිතා කිරීම පිණිස කර්මාන්ත බිමට ගෙන එන ලද ද්‍රව්‍ය ඇතුළු ගිවිසුමට අදාළ වන කර්මාන්තයේ ගිවිසුම පරිසමාප්ත වූ විට කාර්මික නිලධාරිවරයාට භාරදෙන තුරු ගිවිසුම්කරුගේ වගකීම මත පවතින අතර, ඒ පිළිබඳ ගිවිසුම්කරු විසින් ශ්‍රී ලංකාවේ පිළිගත් ආයතනයකින් රක්ෂණ සහතිකයක් ලබාගත යුතු ය. සියළුම ආකාරයේ සිදුවන අවදානම් වලින් සිදුවන සියළු අලාභ හෝ පාඩු සඳහා ගිවිසුම්කරු වගකිව යුතු අතර, තම වියදමින් අලාභ පියවීම කළ යුතු ය. තවද සෑම අකාරයකින්ම පරිසමාප්ත හා පිරිසිදු තත්ත්වයෙන් කර්මාන්තය භාරදීම සම්බන්ධයෙන් ද ගිවිසුම්කරු වගකිවයුතු වන්නේ ය. ගිවිසුම අවසාන වශයෙන් පරිසමාප්ත කොට සියළු කර්මානත වැඩ කොටස් නිසිපරිදි භාරදෙන තුරු ගිවිසුමේ කාර්යයන් සඳහා තම පාලනය යටතේ පවතින සියළු ස්ථාන සහ තැන් පිළිබඳ ආරක්ෂාව ගැනද ගිවිසුම්කරු වගකිව යුතු ය.

අතිරේක වැඩ විෂයන් අත්හැරීම සහ වෙනස් කිරීම

42. මෙහි මින් පෙර සඳහන් විත්‍රසටහන්වල සහ පිරිවිතරවල පෙන්වා සහ විස්තරකර ඇති කර්මාන්තය සම්බන්ධයෙන් කාර්මික නිලධාරිවරයා විසින් අවසර දෙන ලද සියලු අතිරේක වැඩ විෂයයන් අත්හැරීම සහ වෙනස් කිරීම (මෙම ගිවිසුමේ නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ) ගිවිසුම්කරු විසින් කළ යුතු බව සහ ඒවා කිරීමට ඉඩ දිය යුතු බව ගිවිසුම්කරු සහා සේවා යෝජකයා තවදුරටත් ප්‍රකාශිතව එකඟ වන්නේ ය.

එසේ අවසර ලත් අතිරේක කර්මාන්තය කරනු පිණිස අතිරේක කාලය ඉඩදීම සඳහා සම්පූර්ණ කර්මාන්ත සහ ගිවිසුම් පරිසමාප්ත කිරීමට මෙම ගිවිසුමෙන් නියම කර ඇති කාලය සාධාරණ යැයි කාර්මික නිලධාරි වරයා සලකන දිනයකට හෝ දින වලට එක්වරක් හෝ විටින් විට දීර්ඝ කිරීමට කාර්මික නිලධාරි වරයාට හැකි ය.



DS Office Medagama

CamScanner

කර්මාන්තය කිරීම සම්බන්ධයෙන් හා ඒ සඳහා උපදෙස් කාර්මික නිලධාරිවරයා විසින් ලියවිල්ලකින් ගිවිසුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට දිය යුතු ය. උපදෙස්වලට පටහැනි ආකාරයකින් කරන ලද යම් වැඩ විෂයන් සඳහා ගෙවීම් පිළිගනු නො ලැබේ. චිත්‍ර සටහන් වල පෙන්වා ඇති සහ පිරිවිතර වල විස්තර කර ඇති වැඩ විෂයන්ට අතිරේක කිසිම වැඩ විෂයයන් කාර්මික නිලධාරි වරයාගේ නිශ්චිත ලිඛිත උපදෙස් රහිතව භාර නොගත යුතු ය.

***ගිවිසුම්කරු විසින් කර්මාන්තය පිළිබඳව මාසික බිල්පතක් ඉදිරිපත් කළ යුතු බව***

43. කර්මාන්තය කෙරෙන අතරතුර සෑම ලිත් මාසයක ම පළමුවන සතිය ඇතුළත ගිවිසුම්කරු විසින් පසුගිය ලිත් මාසය තුල කරන ලද කර්මාන්ත ප්‍රමාණය පෙන්වමින් එකී කලින් ලිත් මාසයේ අවසානය දක්වා නියමිත ආකෘති පත්‍රයකට අනුව සෑදූ ගෙවීම් වාර්තා බිල් පතක් සකස් කොට කාර්මික නිලධාරි වරයා වෙත හෝ ඔහුගේ කාර්යාලයට බාර දිය යුතු ය. තව ද, එකී කර්මාන්තයේ අතිරේක වැඩ විෂයන් ලෙස දක්වා තිබේ ද, නැද්ද යන බවද එහි දැක්විය යුතු ය. තව ද ගිවිසුම්කරු විසින් ඉදිරිපත් කරන ලද එකී බිල්පතේ එක් එක් වැය විෂයන්හි වටිනාකම හෝ මිල ඉල්ලා සිටිනු ලැබුවේ ප්‍රමාණ පත්‍රයේ යම් වැඩ විෂයක් මතද, ඒ වැඩ විෂයය අංකය යොදා සඳහන් කළයුතුය. කර්මාන්ත කිරීම සම්බන්ධයෙන් හෝ කර්මාන්තය කිරීමේ දී යම් ආකාරයකින් පැන නගින සහ සේවායෝජකයාට එරෙහිව තමා විසින් ඉදිරිපත් කිරීමට ඇති හෝ ඉදිරිපත් කිරීමට සිදු වේ යැයි අදහස් කරන සහ මෙහි සඳහන් දිනයෙහි ඇති කවර හෝ ආකාරයකින් පැනනගින සියළු හිමිකම් පෑම් පිළිබඳ විස්තර එකී මාසික බිල්පත් වල ඇතුලත් කර නොමැති කිසිම හිමිකම්පෑමක් ලබා ගැනීමට ගිවිසුම්කරුට සම්පූර්ණයෙන් තහනම් වන අතර , ඉහත කී එකී බිල්පත් සහ හිමිකම්පෑම් පිළිබඳ විස්තර විධිමත් ලෙස ඉදිරිපත් කරනු ලබන තුරු සේවා යෝජකයා විසින් කිසිම ගෙවීම් කිරීමක් නොකළ යුතු ය.

***බිල්පත්වල වැඩ විෂයන් පරීක්ෂා කිරීම සහ වැඩ විෂයයන් මිනුම් පරීක්ෂා කිරීම***
***සහ ඒවා අගය කිරීම සහ අගය කළ නොහැකි වැඩ විෂයන් අගය කිරීම***

44. ගිවිසුම්කරු විසින්ඉදිරිපත් කරන ලද බිල්පත් වැඩ විෂයයන් කාර්මික නිලධාරියා විසින් පරීක්ෂා කළ යුතු ය. එසේ ම බිල් පත්‍රයේ වැය විෂයන් සනාථ කිරීමට ගිවිසුම්කරු විසින් ඉදිරිපත් කරන ලද සියළු ම මිනුම් පරීක්ෂා කළ යුතු ය.සියළු ම මැනිය හැකි වැඩ විෂයන්වලට වටිනාකම මැනීමේ දී ලබාගත් ප්‍රමාණයන් සඳහා නියමිත ගාස්තු අනුප්‍රමාණය අනුව මිල නියම කිරීමෙන් දැන ගත යුතු ය. මැනිය නොහැකි වැඩ විෂයයන් වටිනාකම එකඟ වූ මිල ගණන් අනුව නියම කලයුතු අතර, ඒ වැඩවිෂයයන් ගිවිසුම් ලේඛණවල කොටසක්වන ප්‍රමාණපත්‍රයේ වැඩ විෂයයන්වල විදහා දැක්විය යුතු ය. අතිරේක වැඩ විෂයයන්වල අත්හැරීම් සහ වෙනස් කිරීම් වල පසුව සඳහන්කර ඇති පරිදි නියමකළ යුතු ය. කාර්මික නිලධාරියා විසින් එම මිනුම් පරීක්ෂා කරන දිනය සහ වේලාව පිළිබඳව පැය 24 ක දැන්වීමක් ලිඛිතව ගිවිසුම්කරුට හෝ ඔහුට නියෝජිතයාට භාරදිය යුතු අතර , ඉහත පරීක්ෂා කිරීම කරන විට කාර්මික නිලධාරියා සමග යාමට ද ගිවිසුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට අවකාශ තිබේ.කාර්මික නිලධාරියා සමග යාමට ගිවිසුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයා නොසලකා හැරියහොත් හෝ පැහැර හැරියොත් හෝ අපොහොසත් වූවහොත් කාර්මික නිලධාරියා විසින් පරීක්ෂා කරනලද මිනුම් අවසානාත්මක සහ තීරණාත්මක මිණුම් ලෙසසැලකිය යුතු ය. පටහැනිව තිබෙන දේශීය හෝ වෙනත් ව්‍යවහාරයක් හෝ සිරිත් නොතකා පරීක්ෂන පිළිබඳ නිසි මිනුම් වලට පමණක් ඉඩදිය යුතු ය. විධිමත් ලෙස දැන්වීමක් කිරීමෙන් පසුව ඉහත පරිදි ගිවිසුම්කරු (හෝ ඔහුගේ නියෝජිතයා ) කර්මාන්තය නිලධාරියා විසින් පරීක්ෂා කරන ලද එකී මිනුම්වල තිබේ යැයි කියනු ලබන එවැනි යම් වරදක් හෝ වරදවල් ගැන එකී පරීක්ෂණයෙන් පැය 24 ක ඇතුළත සේවායෝජකයා වෙත දැන්වීමක් කිරීම ගිවිසුම්කරුගේ (හෝ ඔහුගේ නියෝජිතයාගේ )කාර්යය වන්නේ ය. ඇතැයි කියනු ලබන එවැනි යම් වරදක් හෝ වරදවල් සඳහා හෝ කිසිම හිමිකම් පෑමක් එකී හිමිකම්පෑම් පැය 24 ක් වූ කාලය ඇතුළත ඉදිරිපත් කරනු නො ලැබුවහොත් සලකා නොබැලිය යුතු ය. එවන් අවස්ථාවක කාර්මික නිලධාරියා විසින් පරීක්ෂා කරන ලද මිනුම් අවසනාත්මක සහ තිරණාත්මක මිනුම් ලෙස සැලකිය යුතු ය.එසේ වුව ද වැඩියෙන් ගෙවීම් කරන අවස්ථාවක හෝ වගකීම් කාලය දක්වා සහ ඒ කාලය ඇතුළත කර්මාන්තය හෝ ඉන් යම් කොටසක් හෝ චිත්‍ර සටහන් සහ පිරිවිතර අනුව කර නොමැති බව පෙනී ගිය අවස්ථාවක කිසිම ගෙවීමක් නිසා හෝ සහතිකයක් නිසා හෝ ගිවිසුම්කරු ආරක්ෂා නොවන අතර ආරක්ෂා වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

***අතිරේක වැඩ විෂයයන් අත් හැරීම සහ වෙනස් කිරීම පිළිබඳ වටිනාකම නියම කිරීම***

45. අතිරේක වැඩ විෂයයන් සහ වෙනස් කිරීම පිළිබඳව වටිනාකම නියම කිරීම පහත දැක්වෙන නීතිරීති අනුව කළ යුතු ය.

(අ) ප්‍රමාණ පත්‍රයේ මිල නියමකර ඇති වැඩ විෂයන්ට අදාල,කොන්දේසිවලට සමාන කොන්දේසි යටතේ කරන ලද වැඩ විෂයයන්වල ස්වභාවය සමාන ස්වභාවයේ අතිරේක වැඩ විෂයයන්වල වටිනාකම ප්‍රමාණ පත්‍රයේ සඳහන් අනුප්‍රමාණ අනුව තිරණය කළ යුතු ය.

(ආ) ඉහත කී පරිදි අතිරේක වැඩ විෂයයන් සමාන කොන්දේසි යටතේ කරන ලද අතිරේක වැඩ විෂයයන් නොවන හෝ සමාන ස්වභාවයේ අතිරේක වැඩ විෂයයන් නොවන විට සාධාරණ ලෙස හැකිතාක් දුරට ඉහත කී අනුප්‍රමාණ ඒ කාර්යය සඳහා අනුප්‍රමාණ පදනම් කර ගෙන නියම කර ගත යුතු ය.

(ඇ) එකී අනුප්‍රමාණ අත්හරින ලද වැඩ විෂයයන් වල වටිනාකම සඳහා පදනම විය යුතු ය.එසේ වුව ද ඒ අත්හැරීම නිසා ,කර්මාන්තයේ ඉතිරි වැඩ වි විෂයයන් කරන ලද්දේ යම් කොන්දේසි යටතේ ද,කොන්දේසි වෙනස් වන්නේ නම් එකී ඉතිරි වැඩ විෂයයන් සඳහා අනුප්‍රමාණ මෙහි (අ) ඡේදය යටතේ නියම කළ යුතු ය.



DS Office Medagama

CamScanner

### ගෙවීම් කළ යුතු විශේෂිත අවස්ථාවන්

46. සේවායෝජකයා විසින් පහත සඳහන් අවස්ථාවල දී ගෙවීම් කළ යුතු ය.

1. ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු විසින් සපයනු ලබන හෝ නිෂ්පාදන කරනු ලබන ද්‍රව්‍ය වල මිල සහ/ හෝ නිෂ්පාදනය කරනු ලබන ද්‍රව්‍ය වල මිල සහ / හෝ යම්ද්‍රව්‍ය අපනයනය කිරීම් සහ බෙදාහැරීම් එකී රාජ්‍ය සංස්ථාවල හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල තනි ඒකාධිකාරී වන අවස්ථාවක එකී ද්‍රව්‍ය වල මිල ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ ඒ සඳහා පැවති මිල ඉක්මවා ගිය අවස්ථාවක
2. ශ්‍රී ලංකා ජනරජය විසින් අවසර දෙන ලද හෝ ශ්‍රී ලංකා ජනරජය විසින් සාදන ලද නීති රීති වලින් හෝ නියෝග වලින් හෝ නියම කරන ලද කම්කරු වේතන ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ පැවති වේතන ඉක්මවා ගිය විටක
3. මෝටර් ප්‍රවාහන කොමසාරිස් වරයා හෝ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව විසින් නියම කරන ලද මොටර් ප්‍රවාහන ගාස්තු ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනයේ පැවති ගාස්තු ඉකිමවා ගිය විටක

ඉහත 1 සහ2 වන උප වගන්තිය යටතේ කම්කරු හා ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගෙවිය යුතු ප්‍රමානය ඌව පලාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා )විසින් තීරණය කර ඇති අනුප්‍රමාණ උපලේඛණය අනුව තීරණය කළ යුතුය. එසේ වුවද එසේ කළ යුත්තේ අනු ප්‍රමාණවල මෙම වැඩිවීම සිදුවූ කාලය තුල එකී වැඩ විෂයය කරන ලද නම් පමණකි. අනුප්‍රමාණ උප ලේඛණයෙන් ආවරණය නොවූ වැඩ විෂයයන් සඳහා ගෙවිය යුතු ප්‍රමාණය සම්බන්ධයෙන් කාර්මික නිලධාරියාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වන අතර, ඒ තිරණයෙන් ගිවිසුම්කරු බැඳෙන්නේය.ඉහත 3 වන උප වගන්තිය යටතේ ප්‍රවාහන ගාස්තු අනු ප්‍රමාණවල වැඩි වීම සම්බන්ධයෙන් කරනු ලබන ගෙවීම ගණන් බැලිය යුත්තේ කරන ලද වැඩ විෂයයන් වල ගිවිසුම් ගාස්තු අනුප්‍රමාණවලින් 5% ක් ප්‍රවාහන වියදම් නියෝජනය වන පදනම මත ප්‍රතිශතය වැඩිවීම පදනම මත හෝ තත්කාලින දිස්ත්‍රික් මිල නියම කිරීම් කමිටු නිර්දේශ අනුව ය. තව ද එසේ ගණන් වැඩිවිය යුත්තේ මොටර් ප්‍රවාහන කොමසාරිස්වරයා හෝ දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව විසින් එකී ගාස්තු අනු ප්‍රමාණ වැඩි කරන ලද කාලය තුල එකී වැඩ විෂයය කරන ලදදේ නම් පමණි.මෙම විධිවිධාන යටතේ පැන නැගෙන යම් හිමිකම් පෑම් එකී වැඩි විම හෝ සිදු වූ දින සිට මාසයක ඇතුළත කියනු ලබන වැඩිවීම ඔප්පු කිරීම සඳහා අවශ්‍ය සියළු ලේඛණ සහ දත්ත කාරිමික නිලධාරියා වරයා විසින් නියම කරන ලද ආකෘතියක් අනුව ඉදිරිපත් කළ යුතු ය.

ඉහත සඳහන් ආකාරයට පටහැනිආකාරයකින් කිසිම හිමිකම්ප පෑමක් කිරීමට ගිවිසුම්කරුට සම්පූර්ණයෙන් තහනම් වන අතර , ඉහත සඳහන් ආකාරයෙන් ඉදිරිපත් නොකරන ලද හිමිකම් පෑම සඳහා කිසිම ගෙවීක් අනුමත නොකළ යුතු ය.

### ගෙවීම් කිරිම

47. මෙම ගිවිසුමේ දෙවන වගන්තිය යටතේ සඳහන් කරන ලද මුදල හෝ ඉහත කී පරිදි ගිවිසුම්කරුට ගෙවිය යුතුවන වෙනත් යම් මුදලක් හෝ පහත සඳහන් පරිදි ගිවිසුම්කරුට ගෙවීමට හෝ ගෙවීමකට සැලැස්වීමට සේවායෝජකයා ගිවිසුම්කරු සමඟ මෙයින් එකඟ වන්නේ ය.

(අ) කර්මාන්තයේ ඉටුකරගෙන යන අතර සහ කාර්මික නිලධාරියා වරයා විසින් සහතික කරන ආකාරයට කොටස් වශයෙන් ගෙවීම් කල හැකිය.

(ආ) ඉහත සඳහන් පරිදි ගෙවිය යුතු මුදල් ප්‍රමාණය මිනුම් අනුව තීරණය කරණ ලද සහ උපලේඛණය අනුව විධිමත් ලෙස කරන ලද කර්මාන්තවල සම්පූර්ණ වටිනාකම වන්නේය. එහෙත් මෙහි මින්මතු විධි විධාන සලකා ඇති පරිදි සේවායෝජකයා විසින් රදවා ගත යුතු ප්‍රමාණය ඉන් අඩු විය යුතුය.

(ඇ) ඉහත කි පරිදි රදවා ගත යුතු ප්‍රමාණය විධිමත් කරන ලද කර්මාන්තයේ වටිනාකමින් 10% ක් විය යුතු ය.

(ඈ) එසේ රඳවා ගනු ලබන ලද ප්‍රමාණය මෙම ගිවිසුම අනුව සහ කාර්මික නිලධාරිවරයා සෑහීමකට පත්වන අයුරින් සම්පූර්ණ කර්මාන්තය පරිසමාප්ත කරනු ලබන තුරු සහ සම්පූර්ණ කර්මාන්තය පිළිබඳව කාර්මික නිලධාරි වරයා විසින් පරිසමාප්ත සහතිකයකුත් නිකුත් කරනු තුරු කර්මාන්ත නිසි ලෙස නිම කිරීම සඳහා ඇපයක් ලෙස සේවායෝජකයා විසින් තබා ගත යුතුය. අවසාන සහතිකය නිකුත් කරනු ලැබූ විට එකී රදවා ගනු ලැබූ මුදල ලිවිසුම්කරුට ගෙවිය යුතු ය.

(ඉ) පරිසමාප්ති සහතිකය කාර්මික නිලධාරි වරයා විසින් නිකුත් කරනු ලැබූ වහාම ඔහු විසින් කර්මාන්තය භාර ගත යුතුය. එසේ වුවද, කාර්මික නිලධාරි වරයාට තමාගේ අභිමතය පරිදි කලින් කල තමා සෑහිමකට පතිවන පරිදි සහ මෙම ගිවිසුම අනුව පරිසමාප්ත කරන ලද කර්මාන්තයේ යම් කොටසක් තමා වෙත පවරා ගැනීමට නිදහස ඇත.

(ඊ) සේවායෝජකයා කලින් කර්මාන්තයට ඇතුල්වීම, සන්තකය ලබා ගැනීම හෝ එහි යම් කොටසක් ප්‍රයෝජනයට ගැනීම නොතකා වගකීම් කාලය තුල ගිවිසුම්කරු විසින් විධිමත් ලෙස සහ ගිවිසුමේ සලස්වා ඇති ආකාරයෙන් කර්මාන්තය පවත්වාගෙන ගිය බවට(මෙහි මින්මතු අවසාන සහිතිකය ලෙස සඳහන් කරනු ලබන )සහතිකයක් කාර්මික නිලධාරි වරයා විසින් නිකුත් කරනු ලබන තුරු ගිවිසුම අවසාන වු ලෙස සලකනු නොලැබිය යුතුය. කර්මාන්තය හෝ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ වංචාවක් රැවටීමක් හෝ වංචනික සැගවීමක් වැනි අවසථා වලදී සහ සාධාරණ පරීක්ෂණයක දී හෙළිදරව් නොවන ආකාරයේ කර්මාන්තයේ හෝ ද්‍රව්‍යවල සියළුම දෝෂ සහ ප්‍රමාණවත් නොවනකම් සම්බන්ධයෙන් හැර, එකී කර්මාන්තයේ සහ ද්‍රව්‍යවල ප්‍රමාණවත්භාවය සම්බන්ධයෙන් එම සහිතිකය අවසාන හා තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.



DS Office Medagama

CamScanner

(උ) ඉහත සදහන් කර ඇති පරිදි හැර, කාර්මික නිලධාරි වරයාගේ කිසිම සහතිකයක් , එකී සහතිකය අදාල වන වැඩ විෂයයන් හෝ ද්‍රව්‍ය මෙම විමසුමට අනුකූල වන බවට තීරණාත්මක සාක්ෂියක් නොවන්නේ ය.

*අත්තිකාරම් ගෙවීම*

48. අත්තිකාරම් ගෙවීම සහ ඒවා ආපසු අයකර ගැනීම පහත දැක්වෙන කරුණු අනුව කළ යුතු ය.
    1. ගිවිසුම් මුදලින් 20% ක අත්තිකාරමක් ලබාදිය හැකි ය. ඒ සදහා එම මුදල ආවරණය කිරීම පිණිස සේවායෝජකයා විසින් අනුමත කරන ලද බැංකුවකින් ලබා ගන්නා ලද සහ සේවායෝජකයා විසින් පිළිගනු ලබන බැංකු ඇපයක් ගිවිසුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර, ඉන් පසුව ගෙවීම් කළ යුතුය.
    2. එසේ ගෙවන ලද අත්තිකාරම් මුදල පළමු කොටස් බිල්පත සදහා ගෙවීම් කිරීමේ දී නැවත අය කර ගත යුතු ය.
    3 එම අත්තිකාරම් මුදල ගෙවීම කාර්මික නිලධාරිවරයා විසින් පහත සදහන් කරුණු පිළිබඳව සෑහීමකට පත්වූ පසු කළ යුතු ය.
        ( අ ) එම මුදල් එම කර්මාන්තය සඳහාම යොදවන බව
        ( ආ ) ක්‍රියාත්මක සැලැස්ම අනුව කොන්ත්‍රාත්කරු කර්මාන්තය ආරම්භ කර ඇති බව
        ( ඇ ) මෙම අත්තිකාරම් මුදල යොදවන ආකාරය පිළිබඳව කොන්ත්‍රාත්කරුගේ සහතිකය

*පරිසමාප්ත කිරීමේ කාලය*

49. ගිවිසුම්කරු විසින් කර්මාන්තය සම්පූර්ණයෙන් ම වැඩ නිමකර කාර්මික නිලධාරිවරයා වෙත භාරදිය යුතු ය. එම දිනය මින්මතු <u>නියමිත කාලය</u> ලෙස සඳහන් කරනු ලැබේ. තව ද මෙහි විධිවධාන සලස්වා ඇති පරිදි හැර කවර හෝ හේතුවක් යටතේ හෝ කර්මාන්තය පරිසමාප්ත කිරීම සඳහා එකී දිනය දීර්ඝ කිරීම හෝ වෙනස් කිරීම නො කරනු ඇත. එසේ වුව ද කාර්මික නිලධාරිවරයාගේ මතය අනුව කර්මාන්තය පරිසමාප්ත කිරීමට අදාළ මුල් සැලැස්මේ වෙනසක් නිසා හෝ වැඩ විෂයය හෝ ද්‍රව්‍ය වෙනස් කිරීමට / ආදේශ කිරීමට, අමතර වැඩ විෂයය කිරීමට හෝ අමතර ද්‍රව්‍ය යෙදීමට කාර්මික නිලධාරිවරයා විසින් කරනු ලබන විධානයක් නිසා හෝ වෙනස් කළ නොහැකි ස්වාභාවික හේතුවක් නිසා හෝ අතිශයින්ම අයහපත් කාලගුණය නිසා හෝ බලාපොරොත්තු නොවූ යම් හේතුවක් නිසා කාර්මික නිලධාරිවරයා විසින් පරිසමාප්ත කිරීම සඳහා ලබාදී ඇති නියමිත කාලය ඔහු විසින් නියම කරනු ලබන දිනකට ඔහුගේ අත්සන යටතේ දීර්ඝ කළ හැකිය. එවැනි ප්‍රමාදයක් උද්ගත වූ අවස්ථාවේදීම ගිවිසුම්කරු විසින් කාර්මික නිලධාරිවරයා වෙත ලිඛිතව එය ඉදිරිපත් කළ යුතු අතර, ඒ අනුව කාලය දීර්ඝ කිරීම සිදුකළ යුතුය.කාර්මික නිලධාරිවරයා විසින් කාලය දීර්ඝ කළහොත් හැර නියමිත කාලය ඉක්මනොවිය යුතු ය.

*නියමිත කාලය තුළ පරිසමාප්ත නොකිරීම වෙනුවෙන්*

50. ගිවිසුමේ සඳහන් නියමිත කාලය තුළ හෝ කාර්මික නිලධාරිවරයා දීර්ඝ කරන ලද කාලය ඇතුළත හෝ වෙනත් පිළිගත හැකි හේතුවක් පදනම් කර ගනිමින් ගිවිසුම්කරු විසින් එකී කර්මාන්තය සම්පූර්ණයෙන්ම අවසාන කරනු නො ලැබුවහොත් ගිවිසුම පරිසමාප්ත කිරීම සඳහා එකඟ වූ සහ ඒ සඳහා සීමා කරන ලද කාලය ඉකුත් වීමෙන් පසු එක් එක් දිනය සහ සෑම දිනයක් සඳහාම හෝ අවසාන වශයෙන් දීර්ඝ කරන ලද දිනයෙන් පසුව එක් එක් දිනය සහ සෑම දිනයක් සඳහාම එම කර්මාන්තය සම්පූර්ණයෙන් අවසාන වනතුරු නිසැකව දැනගත් අලාභ සහ ප්‍රමාණ කළ අලාභ ලෙස සේවායෝජකයාට රුපියල් ................................................................................................ ක් වූ මුදල ගෙවීමට සැලැස්විය යුතු ය. එම මුදල ගිවිසුම්කරුගේ ඉහත කී පැහැරහැරීම නිසා දැරිය යුතු කලින් ඇස්තමේන්තු කරන ලද සාධාරණ නියත අලාභ ලෙස මෙයින් තවදුරටත් ප්‍රකාශිතව එකඟ වන්නේ ය. එසේම එම මුදල සියළුම කාර්යය සඳහා දණ්ඩනයක් ලෙස නොව ප්‍රමාණ කළ අලාභ ලෙස සලකනු ලැබිය යුතු ය.

*ගිවිසුම්කරුගේ බංකොලොත් භාවය*

51. බංකොලොත්භාවය පිළිබඳ විනිශ්චය කිරීමෙහිලා අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් ගිවිසුම්කරු බංකොලොත්කරුවෙකු ලෙස ප්‍රකාශ කරනු ලැබ, ඔහුගේ කටයුතු අධිකරණය විසින් ඇවර කරන ලෙස අඬා දි ඇති අවස්ථාවක හෝ මෙම ගිවිසුම අවසාන විමට පෙර ඔහුගේ ණයහිමියන් සමඟ සමථයකට පත්වීමට වෙනත් ආකාරයකින් පියර ගෙන ඇති අවස්ථාවක මෙම ගිවිසුම වහාම අවසාන වියයුතු බවට මෙයින් ප්‍රකාශිතව එකඟවන අතර, එකී කර්මාන්ත වල සන්තකය සේවායෝජකයා වෙනුවෙන් කාර්මික නිලධාරිවරයා විසින් ලබාගැනීම නිත්‍යානුකූල වන්නේ ය. එවිට ගිවිසුම්කරුගේ වියදමින් හෝ බංකොලොත්භාවයට පත් ඔහුගේ බුදලයේ වියදමින් කර්මාන්තය පරිසමාප්ත කර ගැනීම සඳහා අවශ්‍ය සියළු කටයුතු සිදුකිරීමට කාර්මික නිලධාරිවරයාට බලය ඇත්තේය.එවැනි අවස්ථාවක මෙම ගිවිසුම අවසාන කිරීම නිසා ගිවිසුම්කරුට හෝ ඔහුගේ නිත්‍යානුකූල නියෝජිතයාට වන්දියක් ලබා ගැනීමට අයිතිවාසිකමක් නොලැබෙන නමුත් මෙම ගිවිසුම අවසාන දිනය දක්වා කරන එක් එක් වැඩ විෂයයක් සඳහා මුදලක් ලබා ගඅනිමට අයිතිවාසිකමක් ඇත.

*වගකීම් කාලය*

52. කාර්මික නිලධාරි වරයා විසින් පරිසමාප්ත කිරීමේ සහතිකය නිකුත් කිරීමෙන් පසුව වහාම ආරම්භවන පරිදි ලිත් මාස හයක් (06)ක් වූ කාලසීමාවක් සඳහා ගිවිසුම්කරු විසින් කර්මාන්ත නඩත්තු කලයුතු අතර දෝෂ සහිත ද්‍රව්‍ය හෝ දෝෂ සහිත වැඩ නිමාව නිසා උද්ගත වන යම් දෝෂයක් සහිත වැඩ කොටසක් නැවත සකස් කිරීමට ද ඔහු යටත් වන්නේ ය. වගකීම් කාලය තුල යුද්ධ, කැරලි



DS Office Medagama

CamScanner

කෝලහල සහ භූමිකම්පා හැර ගින්න පිපිරීම වලින් වන අනතුරු වලින් කලින් කල සිදුවන ජල ගැලීම් වලින් කර්මාන්තයට සහ හෝ ද්‍රව්‍ය වලට සිදුවන සියළුම අලාභ ඒ අලාභ හෝ පාඩු වගකීම් කාලය ආරම්භ වීමට පෙර ඇති වූ හේතුවක් නිසා සිදු වුනි නම් හෝ කර්මාන්තය නඩත්තු කිරීමේ ලා හෝ දෝෂ සහිත කර්මාන්තයේ යම් කොටසක් නැවත සකස් කිරීමේලා තම බැඳීම ඉටු කිරීමේ කාර්යය සඳහා ගිවිසුම්කරු විසින් කරනු ලැබූ යම් ක්‍රියාවක දී ඒ අලාභ හෝ පාඩු සිදු වුනි නම් , ඒ පිළිබඳ ගිවිසුම්කරු තව දුරටත් වගකිව යුතු අතර ඒ අලාභ හෝ පාඩු තම වියදමින් පියවීමට ගිවිසුම්කරු බැඳි සිටින්නේ ය.

***අළුත්වැඩියා කිරීම ප්‍රතික්ෂේප කිරීම***

53. කර්මාන්තය හෝ එහි කොටසක් හෝ කරන කර්මාන්තය හෝ එහි කොටසක් පරිසමාප්ත කරනු ලබන දිනය ලෙස සහතික කරනු ලබන දිනය ලෙස සහතික කරනු ලැබූ දිනයෙන් පසුව සහ පරිසමාප්ත කිරීමේ සහතිකය නිකුත් කිරීමට පෙර යම් වෙලාවක යම් අළුත්වැඩියාවක් අවශ්‍යයැයි සේවායෝජක විසින් සලකනු ලැබුවහොත් සහ එසේ කරන ලෙස සේවායෝජක විසින් දින 07 ක් තුළ දැනුම් දීමෙන් පසු ගිවිසුම්කරු නිසි උද්යෝගයෙන් යුතුව එකී අළුත්වැඩියාවන් කිරීමට ප්‍රතික්ෂේප කළ හොත් හෝ නොසලකා හැරියහොත් ප්‍රඥාගෝචර යැයි තමා සලකන ඕනෑම ආකාරයකින් සේවායෝජකයා විසින් එකී කර්මාන්තය කර එකී වියදමින් ගිවිසුම්කරු වෙත වියදම් වැය බැර කොට ඔහුට අයවිය යුතු යම් මුදලකින් ඒ මුදල අඩු කර ගත හැකි ය. නැතහොත් සේවායෝජකයා විසින් එකී වියදම් නීති මගින් අය කර ගැනීම හෝ ඉල්ලා සිටින ලද මුදල ගිවිසුම්කරුගෙන් අය විය යුතු බවට සහ /හෝ එම මුදල නීති මගින් අයකර ගැනීමට කාර්මික නිලධාරි වරයා විසින් දෙනු ලබන සහිතිකයක්ද සහිතව සේවායෝජකයාගෙන් එම මුදල සඳහා ඉල්ලීමක් ලැබුණ විට ගිවිසුම්කරු වෙනුවෙන් ඒ මුදල ගෙවීමට බැඳී සිටින ඇපකරු ගෙන් එම මුදල අය කර ගත හැකි ය.

***ගිවිසුම අහිමි කිරීමේ බලය***

54. සේවායෝජකයාගේ මතය අනුව සහ ඔහුගේ තීරණය අනුව ගිවිසුම්කරු
   - ( අ ) සේවායෝජකයා විසින් නියමකරන ලද වේලාව හෝ ආකාරයෙන් කර්මාන්ත ආරම්භ නොකළහොත්,
   - ( ආ ) ගිවිසුම බල පවත්නා කාලය අතරතුර යම් වේලාවක හෝ කර්මාන්ත පරිසමාප්ත කිරීම සඳහා මුලින් දෙන ලද කාල සීමාවට හෝ දීර්ඝ කරන ලද කාල සීමාවට පෙර හෝ පසු කර්මාන්තය පිළිබඳව නිසි උද්යෝගයක් නොදැක් වූව හොත් හෝ ප්‍රගතියක් නො දැක්වුවහොත් ,
   - ( ඇ ) කර්මාන්තය පරිසමාප්ත කිරීම සඳහා දුන් කාලය හෝ ආදේශිත කාලය ගත වන තුරු කර්මාන්තය පරිසමාප්ත නොකළහොත්,
   - ( ඈ ) සේවායෝජකයාගේ/ කාර්මික නිලධාරි වරයා නියමයන් හෝ නිවේදනයන් පිළිනොගතහොත්,
   - ( ඉ ) චිත්‍ර සටහන් වල , පිරිවිතරවල සහ මෙම කොන්දේසි වලට අනුකූලව කර්මාන්තය නොකළහොත්
   - ( ඊ ) සේවායෝජකයා කාර්මික නිලධාරි වරයා විසින් නියම කරන ආකාරයෙන් කර්මාන්තය නඩත්තු නොකළහොත්,
   - ( උ ) ගිවිසුම අත්හැර දැමූව හොත්,
   - (ඌ) ගිවිසුම යටතේ තම බැදීම් කිසිවක් ඉටු නොකලහොත් හෝ හැරියොත්,
   - (එ) කර්මාන්තයෙන් හෝ කර්මාන්තය බිමෙන් යම් ද්‍රව්‍ය හෝ පිරියත හෝ ඉවත් කිරීමට තැත්කළහොත්,

කාර්යක්ෂම ආකාරයෙන් නිසි අන්දමින් කර්මාන්තය කිරීම වහාම ආරම්භ කරන ලෙස කාර්මික නිලධාරිවරයා විසින් ගිවිසුම්කරුට නියම කරමින් කාර්මික නිලධාරි වරයා විසින් ලියවිල්ලකින් ගිවිසුම්කරුට දැන්වීමක් කිරීම නීත්‍යානුකූල වන අතර ,එකී දැන්වීම් භාර දීමෙන් පස් දින 07 ක් තුල ගිවිසුම්කරු විසින් කාර්යක්ෂම ආකාරයෙන් කාර්මික නිලධාරි වරයා සෑහීමට පත්වන පරිදි එකී කර්මාන්තය නිසි ආකාරයෙන් ආරම්භ කිරීම ප්‍රමාද කළහොත් වහාම ගිවිසුම්කරු වෙතලියවිල්ලකින් දැන්වීමක් දී සේවායෝජකයා විසින් ගිවිසුම අවසන් කොට කර්මාන්තය තමා අතට ගැනීම සහ ඉන් පසු මෙම වගන්තිය යටතේ ගිවිසුම අවසාන කිරීමෙන් පසුව ගිවිසුමේ නියමයන්අනුව කාර්මික නිලධාරි වරයා විසින් තීරණය කරනු ලබන වෙනස් කිරීම් සහ අත්හැරීම් ඇතුළුව ගිවිසුම්කරුගේ වියදමින් එම කර්මාන්තය අවසාන කොට පරිසමාප්ත කිරීම සඳහා ගිවිසුම්කරු ලෙස වෙනත් තැනැත්තන් නියුක්ත කිරීම හෝ තමා විසින්ම එම කර්මාන්තය අවසාන කොට පරිසමාප්ත කිරීම සඳහා ප්‍රමාණවත් කම්කරුවන්,ඕවර්සියර්වරුන් නියුක්ත කිරීම සහ ද්‍රව්‍ය යෙදීම නීත්‍යානුකූල වන්නේය. තවද එවැනි අවස්ථාවක ඉහත කී පරිදි එකී කර්මාන්තය අවසාන කිරීමේ දී සහ පරිසමාප්ත කිරීමේ දී ගිවිසුම්කරු විසින් කර්මාන්තය පරිසමාප්ත කරනු ලැබී නම් මෙම ගිවිසුම යටතේ ගිවිසුම්කරුට ගෙවිය යුතු යමු මුදල් ඉක්මවා සේවායෝජකයා විසින් වියදම් කරලද යම් මුදලක් හෝ සියළුම මුදල් සේවා යෝජකයා වෙත ගෙවීමට සහ ඊට අමතරව මෙම ගිවිසුම පරිසමාප්ත කිරීම සඳහාඑකඟ වු සහ සීමා කරන ලද කාලය ඉකුත් වීමෙන් පසු එක් එක් දිනය සඳහා සහ සෑම දිනයක් සඳහා සහ අවසාන වශයෙන් අවසර දෙන ලද දීර්ඝ කරන ලද දිනයෙන් පසු ගිවිසුම්කරුගේ වියදමින් එම කර්මාන්තය අවසාන කොට පරිසමාප්ත කිරීම සඳහා කාර්මික නිලධාරි වරයා විසින් ගිවිසුම්කරුවන් ලෙස සේවයේ නියුක්ත කරන ලද වෙනත් තැනැත්තන් විසින් හෝ තමා විසින්ම එම කර්මාන්තය අවසාන පරිසමාප්ත කිරීම සහ ප්‍රමාණවත් කම්කරුවන් , ඕවර්සියර් වරුන් නියුක්ත කිරීම සහ ද්‍රව්‍ය යෙදවීමෙන් එකී කර්මාන්තය සම්පූර්ණයෙන්ම අවසාන කරන ලද දිනය තෙක් ,එක් එක් දිනය සඳහා සෑම දිනයක් සඳහා නිසැකවම දැනගත් අලාභ සහ ප්‍රමාණවත් කළ අලාභ ලෙස රුපියල් ..........................................................................................................ක් වූ මුදලක් සේවා යෝජකයා වෙත ගෙවීමට ගිවිසුම්කරු යටත් වන්නේ ය.එසේ වුව ද මෙම වගන්තිය



DS Office Medagama

CamScanner

යටතේ මෙම ගිවිසුම අවසාන කිරීමේ දිනය සහ එම කර්මාන්තය පරිසමාප්ත කිරීම සඳහා කාර්මික නිලධාරිවරයා විසින් වෙනත් තැනැත්තන් සේවයේ නියුක්ත කිරීමෙන් හෝ මෙම කාර්යය සඳහා ප්‍රමාණවත් කම්කරුවන් නියුක්ත කිරීමෙන් තමා විසින් එකී කර්මාන්තය පරිසමාප්ත කිරීම සඳහා කර්මාන්තය ආරම්භ කරන ලද දිනය අතර කාල සීමාව තුල ගිවිසුම්කරු විසින් එවැනි කිසිම ආලාභයක් නොගෙවිය යුතු ය. තවද , එක් දිනකට රුපියල් ......................................................................ක් වූ ඉහත කී මුදල ගිවිසුම්කරුගේ පැහැර හැරීම නිසා දරනු ලබන සහ දැරිය හැකි සාධාරණ ලෙස කලින් ඇස්තමේන්තු කරන නියත අලාභ ලෙස සැලකිය යුතු සහ සියළු කාර්යය සඳහා දණ්ඩනයක් ලෙස නොව ප්‍රමාණකළ අලාභ ලෙස සලකනු ලැබිය හැකි යැයි තව දුරටත් ප්‍රකිශිතව එකඟ වන අතර, තවද එකී කර්මාන්තය පරිසමාප්ත කිරීම සඳහා අවශ්‍ය වන යම් හෝ සියළු මුදල් හා ඉහත කී පරිදි නිසැකව අලාභ සහ ප්‍රමාණ කල අලාභ ලෙස අයවිය යුතු මුදලක් හෝ සියළුම මුදල මෙම ගිවිසුම යටතේ හෝ අන්‍යාකාරව ගිවිසුම්කරු වෙත ගෙවිය යුතු හෝ ගිවිසුම්කරුට අය විය යුතු යම් මුදලකින් හෝ මුදල් වලින්ගිවිසුමේ 3 වන වගන්තිය යටතේ ගිවිසුම්කරු විසින් තැන්පත් කරන ලද රුපියල්.......................................................................වූ මුදල කාර්මික නිලධාරි වරයා විසින් අඩුකරගෙන රදවා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.එසේ වුව ද, සේවායෝජකයා විසින් එකී මුදල් නීති නීති මගින් ගිවිසුම්කරුගෙන් හෝ ඔහුගේ පවුලේ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් ලබා ගැනීම හෝ ඉල්ලා සිටින ලද මුදල ගිවිසුම්කරුගෙන් අයවිය යුතු බව සහ /හෝ නීති මගින් අයකර ගැනීමට අදහස් කරන බවට කාර්මික නිලධාරි වරයා විසින් දෙනු ලබන සහතිකයක්ද සහිතව ඉල්ලීමක් ලැබුණු විට ගිවිසුම්කරු වෙනුවෙන් එම මුදල ගෙවීමට බැඳී සිටින ඇපකරුගෙන් එම මුදල අයකර ගැනීම මෙහි සඳහන් කිසිවකින් නො වැලැක්වන්නේ ය.

පහත සඳහන් සාක්ෂිකරුවන් ඉදිරිපිට වර්ෂ දෙදහස් විසිදෙකක් වූ..........................................මස .......................දින එකී ..............................................................................................................
විසින් අත්සන් කරන ලදී.

.........................................                                        .........................................

ගිවිසුම්කරුගේ අත්සන හා නිල මුද්‍රාව

**සාක්ෂිකරුවන්**

| | |
|---|---|
| අත්සන................................................ | අත්සන................................................ |
| නම ................................................ | නම ................................................ |
| ලිපිනය ................................................ | ලිපිනය ................................................ |
| ................................................ | ................................................ |
| ජා.හැ.අංකය ................................................ | ජා.හැ.අංකය ................................................ |

පහත සඳහන් සාක්ෂිකරුවන් ඉදිරිපිට වර්ෂ දෙදහස් විසිදෙවැන්නේ..........................................මස ..........................................දින මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් මැදගම ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන ලදී.

.............................................
ප්‍රාදේශීය ලේකම්,
මැදගම.

**සාක්ෂිකරුවන් -**

| | |
|---|---|
| අත්සන................................................ | අත්සන................................................ |
| නම ................................................ | නම ................................................ |
| ලිපිනය ................................................ | ලිපිනය ................................................ |
| ................................................ | ................................................ |
| ජා.හැ.අංකය ................................................ | ජා.හැ.අංකය ................................................ |
| සකස් කලේ ................................................ | පරීක්ෂා කළේ ................................................ |

දිනය : 2022.



DS Office Medagama

CamScanner